
# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2557 මැදින් මස රවි දින ■ 2014 මාර්තු මස 16 වැනි ඉරිදා



■ දළදා මාළිගාවෙන් නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

2

# ඔබ යන්නේ විනෝද වන්දනා චාරිකාවක්ද?

## ඔබේ ඇඳුම ගැන දෙවරක් සිතා පුදබිම වෙත ඇතුළු වෙන්න



යම්කිසි පුද්ගලයකුගේ චරිතය හෙවත් හැදියාව කියාපෑමේ ප්‍රමුඛම සාක්ෂිය ලෙස ඔහු හෝ ඇය සිය සිරුර වසාගෙන සිටින වස්ත්‍රය හැඳින්විය හැකිය. සිද්ධස්ථානයකට, මංගල අවස්ථාවකට මෙන් හැඳ පැළඳ පැමිණෙන්නේ නම් එම පුද්ගලයාගේ සාමාන්‍ය දැනීම පිළිබඳව ඕනෑම අයකුට ගැටලු මතුවේ.

බෞද්ධ ජනයාගේ මුදුන් මල්කඩ බඳු ශ්‍රී දළද වහන්සේ අභියසට පවා සමහර බැතිමතුන් පැමිණෙන්නේ අනුචිත ඇඳුමින් සැරසීගෙන වීම හාස්‍යයට කරුණක් වීම වැළැක්විය නොහැක.

වන්දනා චාරිකාවකට සහභාගී වන බැතිමතුන්ට පවා විටෙක සිය වස්ත්‍රය පිළිබඳව අමතක වෙයි. ඔවුන් දුරබැහැරක සිට පැමිණෙන බැවින් කිසිවක් බල කොට පැවසිය නොහැකි වුවද සුදු පැහැ වස්ත්‍රයක් වන්දනා ගමනකට අවශ්‍ය අංගයක් බව සිහි තබා ගත යුතුය. මන්නිසාද ඔවුන් විනෝද චාරිකාවක් බවට වන්දනා ගමන හරවා කොට ගෙන ඇති හෙයිනි. සුදු පැහැය හෙවත් ස්වේත වර්ණය පුදබිමක ශාන්ත බව වැඩි කරනු විනා අඩු කරන බව අපි අසා නැත්තෙමු. නමුත් දීප්තිමත් වර්ණ (කහ, රතු, නිල් ආදී) වලින් සැරසී එවන් ශාන්ත පුදබිමකට පැමිණීම කෙතරම් නම් අනෙකාගේ හාස්‍යමය අවධානයට භාජනය වනවාද යන්න සිතා බැලිය යුතුය. තවත් විටෙක සමහර පිරිස් සුදු ඇඳුම භාවිත කරන්නේ ඕනවට එපාවට මෙනි. සම්පූර්ණ සුදු අවශ්‍ය නොවන බව සිතා ශරීරයේ උඩු හෝ පහළ කොටස පමණක් සුදෙන් ආවරණය කරගනී. තරුණ පිරිස් නව විලාසිතාවන්ට මුල් තැන දෙන්නේද පින් බිමකට පැමිණි විටය. ඔවුන් එසේ කරන්නේ තමා සතු හැකියාව, වත්පොහොසත්කම ප්‍රදර්ශනයට මෙනි.



බොහෝ විට මෙහිදී දෝෂ දර්ශනයට ලක්වන්නේ කාන්තා පාර්ශවය බව පෙනී යයි. දණහිසින් ඉහළට වූ කෙටි සායවල්, අත් රහිත හැට්ට ආදියෙන් සැරසී සිටීමෙන් ඔවුනු ආරක්ෂක අංශයේ වුවද බොහෝ විට දෝෂ දර්ශනයට ලක්වෙති. එම සිද්ධස්ථානයන්ට උචිත ලෙස සිය ඇඳුම් පැළඳුම් භාවිත කරන්නේ නම් මෙවන් අපහසුතාවන්ට ලක් නොවේ.


තව කෙනකුගේ ඇඳුම් පැළඳුම පමණක් එලෙස දෝෂ දර්ශනයට ලක්වුවද හැසිරීම කෙරෙහිද උදාසීන වීමට පෙළඹෙන්නේ නිතැතිනි. තරුණ පරම්පරාවේ නොමනා වූ හැසිරීම් මේ අතරින් ප්‍රධාන වේ. ඔවුනු තමා සිටින්නේ සිද්ධස්ථානයක බව පවා විටෙක අමතක කොට සිහින ලොවේ සැරිසරති. විනයක් හා එනා සංයමයකින් යුක්තව කටයුතු කරන්නේ නම් 'විනීතව හැසිරෙන්න' යනුවෙන් දර්ශන පුවරු රඳවීම අනවශ්‍යය.

සංස්කෘතික වටපිටාවෙන් ඉතාමත් ඉහළින් සිටින අප වැනි බෞද්ධයෝ විදේශිකයන්ටත් වඩා ඇඳුමින් පැළඳුමින් අවිනීත වන්නට, එසේ ප්‍රදර්ශනාත්මකව හැසිරෙන්නට සිතට ගන්නේ නම් අනාගත පරම්පරාවට අපේම වූ හැදියාවකින් යුත් අභිමානවත් සංස්කෘතියක් පිළිබඳව කටක් ඇර ප්‍රකාශ කිරීමටවත් යමෙක් ඉතිරි නොවනු ඇත.

අපි සවිනමින්, තමන්ගේ බුද්ධියට අමතමින් තැනට උචිත පරිදි ඇඳුමින්, පැළඳුමින් සැරසීමට වගබලා ගනිමු. එවිට ඇඟිල්ලෙන් ඇන අනෙකාගේ වැරදි පෙන්වීමට අවශ්‍ය නොවනු ඇත.

**හෙෂ්මි සත්සරා - මහනුවර**

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෙන් වෛරයෝ නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්. මෙය පෙර සිට පවතින ස්වභාවයකි."



# ඔබ ජීවිතයේ සැබෑ සතුට සොයා යන කෙනෙක්ද?

මිනිසුන් ජීවිතේ වැඩිපුරම සොයන්නේ මොනවද? කියලා කවදාවත් ඔබ හිතලා තියෙනවද?

ඒ වෙන දෙයක් නොවෙයි, "සතුට". මිනිසුන් සතුට සොයා යන එක කවදාවත් නතර වෙන්නේ නෑ.

පොඩි කාලේ ඉඳන්ම අපට සතුට ලුහුබැඳ යන්න පුරුදු කරලයි තියෙන්නේ. හය නතර තේරෙන කොටම අපිට කියලා දුන්නේ ශිෂ්‍යත්වේ පාස් වුණොත් ගොඩක් සතුටු වෙන්න පුළුවන් කියලා. ඊට පස්සේ හය වසරේ ඉඳන්ම සාමාන්‍ය පෙළට සූදානම් වෙන්න වුණා. එතකොට අපිට අහන්න ලැබුණේ මේක හොඳට සමත් වුණොත් සතුටින් ඉන්න පුළුවන් කියලා. ඒත් ඒ සතුට විඳ ගන්නවත් කලින් උසස් පෙළ වෙනුවෙන් වසර දෙකක අඛණ්ඩ මහා සංග්‍රාමයකට මුල පිරුණා.

ඒ අතරේ හැමෝම කිව්වා සරසවියට ගිහින් උපාධියක් ලබන එක තමයි ලොකුම සතුට කියලා. ඒත් උපාධියක් ලබා ගත්තු අයත් මහා සතුටකින් ජීවත් වෙන බවක් පේන්න තිබුණේ නෑ.

ඔන්න එතකොට තමී බොහොම සාධාරණ ප්‍රශ්නයක් ඇති වෙනවා මේ අපි සොයා යන්නේ සැබෑම සතුටද කියලා. උපාධිය ලබාට රැකියාවක්, විවාහයක්, ගේ දොර ඉඩකඩම්, යානවාහන, දරුමල්ලෝ, ජීවිතයේ සතුට වෙනුවෙන් නොනවතින අරගලයක්ම විතරයි ඉතුරු වෙන්නේ. ඒ කිසිම දෙයක් අවසානේ "ඔන්න අපි නම් ජීවත් වෙන්නේ සැබෑම සතුටින්, මීට වඩා මොන සතුටක්ද?" කියලා කියන්න පුළුවන් තරම් සංතෘප්ත බවකට කිසිම කෙනෙක් පත්වෙන්නෙත් නෑ... අන්තිමේ දී කවුරුත් කියනවා... කියනවා... පතනවා... අනේ!!! අපේ ජීවිතේ අවසාන කාලේ නම් සතුටින්, සැනසිල්ලෙන් ජීවත් වෙන්න ලැබෙන්න ඕනේ කියා. ඔන්න ඒ කාලෙට එතකොට මතක් වෙනවා පින් දහම් කරගන්නත් ඕන කියලා.

ඒත් ඉතින් එතකොට අතපය හරියට වාරු නෑ. කන් ඇහෙන්නේ නෑ. ඇස් පේන්නෙත් නෑ. කෑ අනුභූ දේ මේ පිසක නෑ. හරිහමන් සිහියක් නෑ. ඒත් කොහොම හරි බලනවා මරණින් මත්තෙවත් සතුටින් ඉන්න ක්‍රමයක් හදාගන්න. ජීවිතේ සතුටු වෙන්න බලාගෙන කරපු කිසිම දෙයකින් ඒ කාටවත් "සතුට" ලැබිලා නෑ. "ආයේ උපතුපත් වාරෙට මෙහෙම නම් වෙන්න එපා", "අනේ අපිට සතුටින් ජීවත් වෙන්න ලැබෙන්න ඕනේ" කියන ප්‍රාර්ථනාව ඇතිව, කඳුළු වගුරුව වගුරුව මරණයට පත්වෙනවා. කොහේ ගියාද කියන එක කවුරුවත් දන්නේ නෑ. බොහොමයක් දෙනා ගෙදරම අඳුරු අනුමුලුවල, කුණු කාණුවල, ගොම්මන් අඳුරේ පිළිකණුවල දුගඳ විඳිදවමින් ජීවත් වෙනවා ඇති. තිරිසන් සතෙක් වෙලා ඒ ගෙදරටම එනවත් ඇති. හරියට තෝදෙය්‍ය බ්‍රාහ්මණයාට වුණා වගේ... ඉතින් කොහෙද අර බලාපොරොත්තු තන්දක් උඩ තබා ගත්ත "සැබෑ සතුට".

මේ පුහුදුන් ලෝකය සතුටු වෙන්න හොයාගෙන තියෙන ක්‍රම කිසිවක් සැබෑම වූ, නිරපේක්ෂ වූ සතුටක් ඇති කර දීලා නෑ. ඒ ඒ මොහොතක පවත්වා ගන්න නම් ඒ සතුට ප්‍රමාණවත්. කොහොමත් දිව්‍ය සසර ගමනක් ප්‍රාරම්භ අපි පුරුදුවෙලා තියෙන්නේ ඒ ඒ තැන සතුටින් පිළිගන්නේ. ඒත් සැබෑම සතුට, නිරපේක්ෂ සතුට, නිරාමිස සතුට... ජීවිතයක් තුළ උපද්දවා ගන්නත් අපිට බැරිකමක් නෑ.

ජීවිතයේ උග්‍ර පීඩාවන් විඳ දරාගෙන සතුට සොයාගෙන ගියපු ගමනක අවසානයේ හැමෝම නතර වෙන්න හදන්නේ ඒ සැබෑ සතුට සලසා ගන්න තිබුණ මාර්ගය තුළ, ඒ තමයි පින්දහම් රැස්කරමින් ධර්මයේ හැසිරීම. ඒත් බොහෝ දෙනෙකුට මේ බව මතක් වෙන්නේ වළපයයි, ගොඩපයයි කියා ගන්නම.

එතරම් ප්‍රමාද වෙන්නේ නැතිව ලැබෙන හැම මොහොතකම ධර්මයම පුරුදු කරන්නට පුළුවන් නම් සතුටින් ජීවත් වීම කියන එක පුදුම අභිමයක් බවට පත්වෙන්නේ නම් නෑ... ජීවිතයේ සැබෑම සතුට සාක්ෂාත් කළේ යථාර්ථවාදීව උපදවා ගැනීමෙන් කළ හැක්කක්. පසන දුක්වෙන්නේ නිකෙලෙස් මුනිවරුන් ඒ සතුට ලබාගත්තේ කොහොමද කියන එකයි...

"සිත පහදවාගෙන අපමණ ගුණ ඇති බුදු සමිඳුන් ගැන සිහි කරන්න හැම නිස්සෙම මද වැඩුණ ප්‍රීතිය පැතිර ගිය සිරුරක් ඇති කෙනෙක් වෙන්න,

"සිත පහදවා ගෙන අපමණ ගුණ ඇති බුදු සමිඳාණන්ගේ ධර්මය සිහි කරන්න. හැම නිස්සෙම මද වැඩුණ ප්‍රීතිය පැතිර ගිය සිරුරක් ඇති කෙනෙක් වෙන්න.


සිත පහදවා ගෙන අපමණ ගුණ ඇති බුදු සමිඳාණන්ගේ ශ්‍රාවක වූ අපමණ ගුණ ඇති සඟ පිරිස සිහි කරන්න. හැම නිස්සෙම මද වැඩුණ ප්‍රීතිය පැතිර ගිය සිරුරක් ඇති කෙනෙක් වෙන්න."


(තේකිච්ඡකාරී තෙරුන්ගේ ගාථා)

ජීවිතයේ සතුට සොයා යන ඔබත් හැමනිස්සෙම මද වැඩුණ ප්‍රීතිය පැතිර ගිය සිරුරක් ඇති කෙනෙක් වෙන්න.

ඩී. එම්. වික්‍රමසිංහ

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පවට ආශා නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."





# මම රහත්


## යැයි කී පමණින් එය පිළිගත යුතු නැත

බුදුරජාණන් වහන්සේ පහළ වූ අවධියේත් ඇතැම් පුද්ගලයින් 'මම රහත්........ මම රහත්' යැයි කියමින් මිනිසුන්ගෙන් වැඳුම් පිදුම්, ගරු සම්මාන ලද බව අපි දනිමු. නිගණ්ඨ නාථ පුත්ත, පකුධ කච්චායන, මක්ඛලි ගෝසාල වැනි ප්‍රකට ප්‍රසිද්ධියට පත්ව සිටි ෂඩ් ශාස්තෘවරු එයින් කිහිප දෙනෙකි. සාමාන්‍ය මිනිස් චර්යාවන්ට වඩා වෙනස් හැසිරීම් හා වෙනස් ආකාරයේ කතා බහ පවත්වන අය, උන්මත්තකයින්, නැතිනම් යම් මානසික බලයක් ඇති උදවිය ලෙස එද මෙන්ම, නූතන සමාජයේත් වැඩි දෙනෙක් පිළිගනිති. මක්ඛලි ගෝසාලගේ චරිත කතාව එය අපට හොඳින් පැහැදිලි කර දෙයි. ඔහු සේවකයෙකි. දිනක් තම ස්වාමියාගේ ඉල්ලීම මත, තෙල් කළයක් රැගෙන යාමට ඔහුට සිදුවිය. හිස මත තෙල් කළය තබාගෙන යාම අවදානම් බව දත් ස්වාමියා, සේවක කලීට ප්‍රවේශම් වන ලෙස උපදෙස් ලබා දී, තෙල් කළය හිස මත තබා ඔහුගේ අසුපසින් පැමිණියේය. අතරමග ජලාශයකින් එතෙරවීමට යොදා තිබුණු ඒ දණ්ඩක් ඔස්සේ ගමන් කිරීමට සිදුවිය. ප්‍රවේශමෙන් යුතුව ගමන් කළත්, මැද දී කලිගේ පය ලිස්සායාම නිසා තෙල් කළය ජලාශයට වැටුණි. තමන්ට දඬුවමක් ලැබේ යැයි සිතා 'කලී' කලබල විය. කෝපයට පත් ස්වාමියා "මාකලී ... මාකලී" යැයි "කලබල නොවන්න කලී" කියමින් ඔහුගේ ඇඳුමෙන් අල්ලා ගැනීමට උත්සාහ කළෙන් වස්ත්‍රය ගැලවිණි. කලී අඳුම නොබලාම දුවන්නට විය. කලබලයෙන් නිරුවත්ව මහමග දුවන කලී දුටු බොහෝ දෙනා, ඔහුගෙන් ප්‍රශ්න කළහ. ඔහු පිළිතුරු දුන්නේ "තමන් නූල් පොටක දෙයකටවත් ආසාවක් නොදක්වන රහතන් වහන්සේ කෙනෙකු" බවයි. ඔහුගේ බස පිළිගත් ඇතැම්හු ඔහුට වන්දනා කළහ. පුද පූජා පැවැත්වූහ. පමණෙරු ඔහු සතු කිසියම් දහමක් ඇද්දැයි සොයා බැලූහ. එද භාරතයේ සිටි තමන් රහත්යැයි කියාගත් බොහෝ දෙනා එවැනි පුද්ගලයින්ය. අද අපේ සමාජයේ ද තමන් රහත් යැයි කියා ගන්නා අය සිටිති. ඔවුන් රහත්ද? නැද්ද? යන්න සොයා බලනවාට වඩා අප කළ යුත්තේ රහත් බව ලැබූ කෙනෙකු තුළ ඇති අභ්‍යන්තරික ලක්ෂණ හඳුනා ගැනීමට ධර්මානුකූලව උත්සාහ කිරීමය. මේ සඳහනෙහි යම් භික්ෂුවක් "මගේ ජාතිය ක්ෂය විය. එබැවින් මගේ නැවත උපතක් නැත. බඹසර වසන ලදී. කළ යුතු සියලු කාර්ය නිම කළෙමි. මම දැන් රහත් බව ලබා සිටිමි." යි ප්‍රකාශ කළහොත්, එය එකවරම පිළිගත යුතු නැත. ප්‍රතික්ෂේප කළ යුතු ද නැත. ඔහුගෙන් ප්‍රශ්න කළ යුතු යැයි (නාස්ස භික්ඛවේ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං, නප්පටික්කොසිතබ්බං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා පඤ්හො පුච්ඡිතබ්බො) යනුවෙන් ඡබ්බිසෝධන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දක්වා තිබේ. එපමණක් නොව , එවැනි අයෙකුගෙන් විමසිය යුතු ප්‍රශ්නද මේ සූත්‍රයට ඇතුළත්ව තිබේ.

අපි පුද්ගලයින් වර්ග කරන්නේ ජාති , කුල, ආගම් වර්ණ වැනි මතුපිට නැතිනම් බැහැරින් පෙනෙන ලක්ෂණ පදනම් කර ගෙනය. බුදුරජාණන් වහන්සේ පුද්ගලයින් වර්ග කරනු ලැබුවේ ඔවුන්ගේ අභ්‍යන්තරික ලක්ෂණ සැලකිල්ලට ගැනීමෙනි. මතුපිටින් පෙනෙන ලක්ෂණවලින් පුද්ගලයින් මැනීම බුද්ධ දේශනාව අනුමත නොකරන බව වසල සූත්‍රයේ දී "උපතින් කිසිවෙකුත් වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු නොවන බව" දැක්වීමෙන්ම පැහැදිලි වෙයි.

පෘථග්ජනයා හා ආර්යය යනු බෞද්ධ පුද්ගල වර්ගීකරණයේ ප්‍රධාන භේද දෙකකි. බුදු පසේ බුදු හා මහරහත් යන පිරිස ආර්යයන් වහන්සේලා ලෙස ගැණෙති. වෙනත් ලෙසකින් කිවහොත්, මග පල ලද උතුමෝ ආර්යය නමින් හැඳින්වේ.

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි. හේ තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. වෙහෙසෙයි පෙළෙයි."



මේ බෙදීමට පදනම වන්නේ පුද්ගලයාගේ සිත තුළ ඇතිවෙන වෙනස් බවයි. ආර්ය තත්ත්වයට පත්වන්නේද, පුහුදුන් තැනැත්තාමය. අපි උපතින් මනුෂ්‍යයෝ වෙමු. අප සතු ශරීරය ප්‍රධාන වශයෙන් ගත හා සිත යනුවෙන් කොටස් දෙකකි. රූප හා නාම යනුවෙන් ද දහමෙහි මේ දෙකොටස දක්වා තිබේ. අප සතු සිරුර පංචස්කන්ධය වශයෙන් ද හඳුන්වනු ලබයි. ඒ රූප, වේදනා, සංඥා, සංඛාර හා විඤ්ඤාණ යන කොටස් පහේ එකතුවක් නිසාය. මෙයින් රූපය නම් සම්, මස්, ඇට, ලේ , නහරවලින් සමන්විත මේ සිරුරයි. ඉතිරි හතරම සිත සමග බැඳුණකි. සිතක් පහළ වුණා යැයි කියන්නේ ස්කන්ධ පහ සහිත සිතක්, එනම් පංචස්කන්ධ සහිත සිතක් ඇතිවීමයි. ඒවා ධර්මයේ උපාදානස්කන්ධ ලෙස දක්වෙයි. මෙසේ පහළ වන සිතිවිලිවලට පුද්ගලයා ප්‍රතිචාර දක්වන ක්‍රම දෙකකි. සිතිවිල්ල සඳින් අල්වාගෙන කටයුතු නොකිරීම එක් ක්‍රමයකි. ඇතිවෙන සිතිවිල්ලෙහි ඇලී ගැලී කටයුතු කිරීම අනෙක් ක්‍රමයයි. උපාදානස්කන්ධ නමින් දක්වන්නේ මේ දෙවැනි ක්‍රමයයි. මේ උපාදානස්කන්ධ ඇති කරගනු ලබන්නා පෘථග්ජනයෙකි. මෙලෙස අල්ලා ගැනීමක් ඇති වන්නේ කෙලෙස් නිසාය. කෙලෙස් නැති විට අල්ලා ගැනීමකින් තොරය. එවිට පහළවන්නේ ස්කන්ධ පමණකි. ස්කන්ධ පමණක් ඇතිවන අය රහතන් වහන්සේ නැතිනම් ආර්යයන් වහන්සේ ලෙස හඳුන්වයි.

ඉන්ද්‍රිය මගින් ගන්නා අරමුණු ක්‍රියාත්මක වන ආකාරය මධු පිණ්ඩික සූත්‍රයේ ඉතා මැනවින් පෙන්වා දී තිබේ. ඇසත්, රූපත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. එමෙන්ම ඇස , රූපය හා චක්ඛු විඤ්ඤාණය යන තුනේ එකතුව ස්පර්ශය නම් වෙයි. (තිණ්ණං සංගති ඵස්සො) ස්පර්ශය නිසා වේදනාව හටගනී. අනතුරුව එය හඳුනාගනී. ඒ ගැන විතර්ක කරයි. පසුව විතර්ක කරන ලද දෙය පිළිබඳව ප්‍රපංචයක් ඇතිකර ගනී. ප්‍රපංචය අතීත, වර්තමාන හා අනාගත ඇසින් බලා ඊට පුද්ගලයා යටපත් වෙයි. ප්‍රපංචයට යටවන තැනැත්තා මෙහෙයවනු ලබන්නේ එම ප්‍රපංචය විසිනි.

මේ ක්‍රියාවලිය සරලව ඉදිරිපත් කළහොත් මෙසේ දක්විය හැකිය. ඇහැට රූපයක් ගැටුණු විට ඒ පිළිබඳ සිතිවිල්ලක් ඇතිවේ. ඒ චක්ඛු විඤ්ඤාණයයි. අනතුරුව ඒ රූපය අසවල් එක යැයි නිවැරදිව හඳුනා ගනී. එනම් සංජානනය කරයි. හොඳින් හඳුනාගත් විට තමන් කැමති , රුචි කරන දෙයක් නම්, සතුටක් උපදී. අකමැති දෙයක් නම් පිළිකුල් කරයි. එය ගැටීමකි. ඇතැම්විට මැදහත් දෙයක් වීමටද පුළුවන. මෙසේ වේදනාව හෙවත් විඳ ගැනීම තුන් ආකාරයකට සිදුවේ. මේ ඇලීම හෝ ගැටීම නිසාම ඒ ඔස්සේ නොයෙක් විදියේ කල්පනා උපදී. තර්ක විතර්ක ඉදිරිපත් වෙයි. එහි ප්‍රතිඵලයක් හැටියට තරහව, වෛරය, ලෝභය , පළිගැනීම වැනි කෙලෙස් සිතිවිලි උපදී. "තණ්හා පච්චයා උපාදානං" යනුවෙන් පටිච්ච සමුප්පාදයේ වදාළේ ද මේ කාරණයමය. ඇලීමත් , ගැටීමත් දෙකම තණ්හාවේම ස්වරූපයන්ය.

මිනිසා තමන් කැමති දේවලට ඇලීමක් ඇතිකර ගන්න පමණක් නොනවතී. ඒ ඇලීමට බඳුන් වූ දේ ගැන නැවත නැවත සිතයි. තමන් සතු කර ගැනීමට සිතයි. ඊට එරෙහි වන සාධක ඇද්දැයි සොයා බලයි. එසේ ඇත්නම් ඒවා කෙරෙහි කෝපයක් ඇතිකරගෙන , නැතිකර දැමීමට උපක්‍රම සොයයි. තමාගේ බවට පත්කර ගැනීමට සිතීම නිසා "මගේය, මගේ" යන හැඟීම වැඩවත් වෙයි. තමන් සතු [illegible] සවිඤ්ඤාණක යන හැඟීම ආ [illegible] මානයක් ඇතිකර [illegible] පමණට වුවමනා [illegible] ප්‍රාර්ථනා. ඔට වුවමනා ලෙස [illegible] ඒ පිළිබඳ ආධිපත්‍ය ඇතිකර ගනී. [illegible] ලෙස මෙය ධර්මයේ දක්වෙයි. [illegible] තණ්හා, දිට්ඨි, මාන [illegible] කෙලෙස් සිතිවිලි තුන නිසා [illegible] සංඥාව ප්‍රබල වෙයි. පැතිර [illegible] අවසානයේ දී තමන් විසින් [illegible] ප්‍රපංචයට යට වී වහලෙකු මෙන් [illegible] ප්‍රපංචවලට සතුටු වන්නා සියලු [illegible] වැඩිකර ගන්නේ මෙලෙසිනි.

"ප්‍රපංචාභි රතා පජා , නිප්පපංච තථාගතා" යනුවෙන් දක්වෙන්නේ [illegible] මිනිස් ප්‍රජාව ප්‍රපංචයෙහි ඇලී ගැලී [illegible] තථාගතයන් වහන්සේ නිෂ්ප්‍රපංච [illegible] යනුවෙනි. [illegible] රහතන් වහන්සේලාද ඉඳුරන්ගෙන් අරමුණු ගනිති. [illegible] අරමුණු සංජානනය කොට හඳුනා ගනිති. එහෙත් අප මෙන් සුඛ, දුක්ඛ හෝ අදුක්ඛමසුඛ වශයෙන් ඒවා වින්දනය නොකරති. අරමුණෙහි ඇලීමක් නැත. ඒ තුළ නිත්‍ය නොවන බව හා දුක් සහිත බව අවබෝධ කර ගනිති. එනිසාම උන්වහන්සේලාගේ සිත කිසිම අවස්ථාවකදී කම්පාවට පත්නොවේ.

"ඵුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං ඒතං මංගල මුත්තමං"

අරහත් බව ලැබූ කෙනෙකු තුළ විද්‍යමාන වන ලක්ෂණ කීපයක් මංගල සූත්‍රයේ එන මෙම ගාථාවෙන් දක්වෙයි. උන්වහන්සේලා අරමුණෙහි ඇලීමක් හෝ ගැටීමක් ඇති නොකරන බැවින් , ලාභ, අලාභ, අයස, යසස , නින්ද , ප්‍රශංසා , සැප, දුක් යැයි කියවෙන අටලෝ දහමෙහි නොසැලී සිටිති. මහා පොළොවට වුවද නොසෙල්වෙන පර්වතයක් මෙනි. අරමුණුවල නිත්‍ය බවක් නැතැයි යන අවබෝධයෙන් කටයුතු කිරීම නිසාම, දුක හා ශෝකයද නැත. පුද්ගල සන්තානයේ රාගාදික කෙලෙස් හටගන්නේ අනවබෝධය නිසාය. රහත් බව ලද උතුමන් ලෝකයේ සතු මනාව නුවණින් අවබෝධ කර ඇති බැවින් උන්වහන්සේලා තුළ කෙලෙස් සිතිවිලි ද නොමැත.

**පූජ්‍ය හෙට්ටිකන්දේ ඤාණානන්ද හිමි**
කටුගස්තොට මුල්ලේගම දීපාලෝක විහාරාධිපති

# බලපෑම් මගින් ආගම් මාරුවට නීතියෙන් අවසර තිබේ ද?



ශ්‍රී ලංකාවාසී සෑම පුරවැසියකුටම තමන් කැමති ආගමක් නිදහසේ ඇදහීම, වැළඳ ගැනීම ඇතුළු සිතීමේ නිදහසත්, හෘදය සාක්ෂියට අනුව කටයුතු කිරීමේ නිදහසත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 10 වන ව්‍යවස්ථාවෙන් ලබාදී ඇත. එය බෞද්ධයන් ඇතුළු සියලු ආගමිකයන්ට ලැබෙන මූලික මිනිස් අයිතිවාසිකමකි. එසේම බෞද්ධයන්ට මෙන්ම අපේ රටේ සෑම පුරවැසියකුටම ආගම ඇදහීමේ පොදු අයිතිවාසිකමක්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (ඉ) ව්‍යවස්ථාවෙන් හිමිවෙයි.

"සෑම පුරවැසියකුටම එකලාව හෝ අන් අය සමග ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, පුහුණු කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය" යනුවෙන් එහි සඳහන් වෙයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෑම පුරවැසියකුටම ලබාදී ඇති ආගම් ඇදහීමේ සහ ආගම් පිළිපැදීමේ මූලික අයිතියට බෞද්ධ අබෞද්ධ සියලු දෙනා ගරු කළ යුතුය.

ආගමක් ඇදහීමට සියලු දෙනාටම නිදහස තිබුණත්, කිසියම් ආගමක් අදහන තැනැත්තකුට අයුතු බලපෑම් සිදුකොට බලහත්කාරයෙන් ඔහුගේ ආගම මාරුකිරීම නීති විරෝධිය. එය ජාත්‍යන්තර නීතියකි. ඉන්දියානු ව්‍යවස්ථාවට අදාළ ස්ටැනිස්ලෝස් අධිකරණ තීන්දුව සහ ජාත්‍යන්තර අධිකරණයේ විභාග වූ ක්‍රිසියට සම්බන්ධ නඩු තීන්දුවක් ඒ සඳහා ආදර්ශය ලෙස යොදා ගනු ලැබේ.

කිසියම් ආයතනයක් ආර්ථික ආධාර ලබාදීම හෝ සහන සැලසීම මගින් ආගම් මාරුකරවීමේ සැලසුම් ක්‍රියාත්මක කරයි



නම්, ඒ සඳහා අවස්ථාව ලබාදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වගන්තිය උල්ලංඝනය කිරීමකි. බෞද්ධයන්ට ප්‍රවිෂ්ට වූ එම අයිතිය ඉක්මවා කටයුතු කිරීමට වෙනත් ආගමිකයන්ට කිසිදු අයිතියක් නොමැති බව අවධාරණය වන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු 3ක් තිබේ. ක්‍රිස්තියානු සභාවේ දොරටුව යාඥා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීමේ පනත, (තීන්දුව අංක 2/2001), නිව් වයින් හාවස්ට් මිනිස්ට්‍රි සංස්ථාගත කිරීමේ පනත (තීන්දුව අංක 2/2003) සහ ශ්‍රී ලංකාවේ මෙන්සින්ගන්හි යාන්ත ප්‍රැන්සිස්කෝ කුළුවන නිකායේ කොටුම්පත පිළිබඳ අංක 19/2003 ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය බෞද්ධ අයිතිවාසිකම් තහවුරු කරයි. බුද්ධාගම පිළිබඳ ව්‍යවස්ථානුකූල අයිතියට බාධාවක් වන නිසා ඉහත සඳහන් පනත් තුන සම්මත කිරීම අධිකරණය විසින් වළක්වන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ නො. 19/2003 දරන තීන්දුවෙන් ඒ බව ප්‍රකාශ කෙරුණේ මෙසේය.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සහ 14 (1) ඊ වගන්තිවලින් සියලුම ආගම්වල සිය අයිතිය ලබාදිය යුත්තේ, 9 වන ව්‍යවස්ථාවෙන් බැඳී ඇති බුද්ධ ශාසනයට ආරක්ෂාව සහ පෝෂණය සැලසෙන අයුරිනි. එමනිසා, අනෙක් ආගම්වලට අයත් තම අයිතිය භුක්ති විඳිය යුත්තේ බුද්ධාගමට හානියක් නොවන ආකාරයටයි. ආගමට හැරවීමෙන් නිදහස් චින්තනයට බලපෑම් සිදුවන නිසා එය වරදකි."

*(2003 අගෝස්තු 5 දින පාර්ලිමේන්තු ප්‍රකාශනය.)*

"ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණ ඇතිව, එනම් ආගමට හරවා ගැනීමේ අරමුණින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, වැඩිහිටි නිවාස, අධ්‍යාපන ආයතන, සෞඛ්‍ය කඳවුරු, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, අනාථ නිවාස ආදිය පවත්වාගෙන යාම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුද්ධ ශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීම පිළිබඳ 9 වන වගන්තියට පටහැනිය."

*(අංක 19/2003 දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය.)*

මේ අනුව පැහැදිලි වන්නේ ආගම් ප්‍රචාරයේ නිරත වන පුද්ගලයන් බෞද්ධයන්ගේ සිතීමේ හා ආගමික නිදහසට බාධා කරමින් ආගම වෙනස් කිරීමට උත්සාහ කිරීම නීති විරෝධී බවයි. එම නිසා, ආගම් ප්‍රචාරය සඳහා බෞද්ධයන්ගේ නිවෙස්වලට වන අයට එරෙහි වීමේ නීත්‍යානුකූල අයිතිය බෞද්ධයන්ට තිබේ. එසේම ආධාර උපකාර කිරීමේ මුවාවෙන් බෞද්ධයන් අන්‍යාගම්වලට හැරවීමේ නිරත ආයතනයන්ට එරෙහිව නීතිමය පියවර ගතයුතු වෙයි. ඒ සඳහා බෞද්ධයන් දැනුවත් කිරීම හා මූලිකත්වය ගැනීම භික්ෂූන්ගේ වගකීමකි.

**පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි**
ගරු අනුශාසක, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

# ඔබ සිල්වත් නම් දෙවියන් පවා වඳීවි...

දස පාරමිතා අතර දෙවන පාරමිතාව වන්නේ සීලයයි. ත්‍රිප්‍රකාර ශික්ෂා තුළද දෙවන අංගයට ගැනෙන්නේ සීලයයි. තවත් බොහෝ තැන්වල සීලයට පළමු ස්ථානයත්, දෙවන ස්ථානයත් ලබාදී ඇත. ඇත්තෙන්ම සීලයට මෙතරම් වැදගත් ස්ථානයක් ලබාදී ඇත්තේ මන්ද යන්න අප නුවණින් විමසිය යුතු කරුණකි.

ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ සියලු කරුණු ප්‍රධාන කොටස් 3කට බෙදා දක්වා ඇත. එනම් සීල, සමාධි, ප්‍රඥා වශයෙනි. සීලය මිනිසෙකුට ඇති ආභරණයයි. සිල්වත් වීම හැම කෙනෙකුටම කළ නොහැකිය. නමුත් සිල්වත් වීම තුළ දෙවි දේවතාවුන්ගේ පවා වන්දනා මානවලට ලක්වීමට හේතුවක් වන්නේය. ආභරණයක් පැළඳීම තුළින් දිස්නයක් දෙනු ඇත. රන්, රිදී, මිණි, මුතු ද්‍රව්‍ය සකස් කරන ලද ආභරණ බොහෝ දෙනෙක් පළඳිනු ඇත. එහි බැබළීම සීමා රහිතය.

නමුදු සීලය නමැති ආභරණය පැළඳීම තුළින් මුළු විශ්වය තුළම දීප්තය නැත්නම් බැබළීම සිදුවේ. ඒ බව ධම්මපදයේ පුප්ඵ වග්ගයේ 12 වෙනි ගාථාව තුළින්ද පැහැදිලි වේ.

"චන්දනං තගරං වාපි
උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං
සීලගන්ධෝ අනුත්තරෝ"

එහි අර්ථය වන්නේ සඳුන් සුවඳ, මල් සුවඳ අතුරෙන් හට ගැනෙන ([illegible]) සුවඳට වඩා සිල් සුවඳ මැ ඉතා අග්‍රයේය. මේ ගාථාව තුළින් පැහැදිලි වන්නේ මල් සුවඳට වඩා සිල් සුවඳම මේ ලෝක ධාතුව තුළ පැතිරෙන බවයි. එම වග්ගය තුළම 13 වෙනි ගාථාව තුළින් සිල් සුවඳ දෙවියන් අතර පවා පැතිරෙන බව දේශනා කොට ඇත.

"අප්පමත්තෝ අයං ගන්ධෝ
යායං තගර චන්දනී
යෝ ච සීලවතං ගන්ධෝ
වාති දේවෙසු උත්තමෝ"

එහි අර්ථය වන්නේ තවරලා සඳුන් සුවඳ ඉතා සුළුය. සිල්වතුන්ගේ සුවඳ දෙවියන් අතර පවා පැතිරේ. සිල් සුවඳ මුළු විශ්වය පුරාම පැතිරුණු ආකාරය බුද්ධ චරිතය තුළින්ද විද්‍යාමාන වේ. බුදුහිමි ඇතුළු රහතන් වහන්සේලාගේ සිල් සුවඳ මුළු තුන් ලෝකයේම පැතිරුණු ආකාරය ත්‍රිපිටකය තුළ විද්‍යාමාන වේ. විශේෂයෙන් බුදු හිමියේ සිල් සුවඳ මුළු තුන් ලෝකයේම පැතිරුණු ආකාරය ඉතා මැනවින් ත්‍රිපිටකය තුළ පැහැදිලි කොට ඇත.

බුදු හිමිට වඳින්නේ, පුදන්නේ උන්වහන්සේ සාක්‍ය කුලයක නිසා හෝ බොහෝ වස්තු සම්පත් තිබූ නිසා නොවේ. උන්වහන්සේ තුළ පැවතුණ මහා ගුණයන් හේතුවෙනි. ඒ අතර නව අරහාදී බුදුගුණ ඉතා වැදගත් වේ. සුගත ගුණය තුළින් පැහැදිලි වන්නේ මනා ඇවතුම් පැවතුම් ඇති ශාන්ත ස්වභාවයයි.

"අප්පසන්නානං පසන්නාය
පසන්නානං භිය්‍යෝ භාවාය" පැහැදුණු අයගේ වැඩි පැහැදීම උදෙසාත්, නොපැහැදුණු අයගේ පැහැදීම උදෙසාත් සීලය හේතු වේ. කාලේ පාලකයෙක් වූ අශෝක මහ රජතුමා නාගේන්ද්‍රෝට පොඩි හාමුදුරුවන්ගේ සංවර භාවය දැක පැහැදුණු බව බෞද්ධ සාහිත්‍යය තුළ සඳහන් වේ. සිද්ධාර්ථ කුමාරයා දැක කිසාගෝතමිය නිබ්බුත පද කීවේද සිදුහත් කුමරුගේ මනා සංවර භාවය දැකීම තුළිනි. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේදී පරලොව සඳහා දෙනු කරුණු 4න් එකක් වන්නේත් සීල සම්පදාවයි.



## ඇත්තෙන්ම සීලය යනු කුමක්ද?

සීලය යනු කය හා වචනය සංවර කරගැනීමයි. භික්ෂු සමාජය තුළ උපසම්පද භික්ෂු භික්ෂුණීන්ට ප්‍රාතිමෝක්ෂ සංවර සීලයත්, සාමණේර සාමණේරියන් සඳහා දස සීලයත් දේශනා කළ අතර ගිහි සමාජය තුළ උපාසක උපාසිකා පිරිස් සඳහා පංචසීලය සහ අෂ්ටාංග සීලය ප්‍රධාන වශයෙන් දේශනා කොට ඇත. සිත අපට නොපෙනෙන දෙයකි. එහි කොතරම් අසංවර භාවය තිබුණද එය නොපෙනෙනු ඇත. නමුදු සිතෙහි සංවර භාවය හෝ අසංවර භාවය කයට හා වචනයට බලපානු ඇත. සමාජයට කෙනෙකු පිවිසෙන විට ඔහුගේ හැදියාව දෙස මුළුමහත් සමාජයම බලනු ඇත. එහිදී එම පුද්ගලයා සමාජ පිළිකාරයෙක් නම් ඔහු බිහි කළ දෙමව්පියන්ට පවා අපහාස විඳින්නට සිදුවනු නියතය.

සමාජයේ හොඳට හැදුණු පුද්ගලයාට ඉහළම ගෞරවය හිමිවනු ඇත. එය මිනිස් ලොව පමණක් නොව දෙව් ලොව පවා සිදුවනු ඇත. අපගේ ඉන්ද්‍රියයන්වලට ගෝචර නොවන දිව්‍ය ලෝකයේ දෙවි දේවතාවුන්ගේ වැඳුම් පිදුම් නිරන්තරයෙන් මිනිස් ලොව සිල්වතුන්ට ලැබෙනු ඇත. එයට උදාහරණ නොයෙකුත් ත්‍රිපිටකය තුළ අන්තර්ගතය.

දිනක් බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණි එක්තරා දේවතාවෙක් අභ්‍යන්තරික වූත්, බාහිර වූත් ක්ලේශ ජටාව නැති කළ උත්තමයා කෙසේදැයි ප්‍රශ්න කළේය. ඊට බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ.

"සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ
චිත්තං පඤ්ඤං ච භාවයං
ආතාපී නිපකෝ භික්ඛු
සෝ ඉමං විජටයේ ජටං"

ඉහත ගාථා ධර්මයට අනුව බෞද්ධ විමුක්ති මාර්ගයෙහි මූලිකම පදනම සීලය වන බව ඉතා පැහැදිලිය. සදාචාර ධර්ම මාර්ගය විමුක්තිය ලබාගැනීම සඳහා ක්‍රියාත්මක වන ශ්‍රාවකයාගේ මූලික කාර්යය ලෙස උගන්වනු ලබන්නේද එහෙයිනි. බුදුදහමේ පැහැදිලි වන හොඳම උදාහරණයක් ලෙස දිනක් ශක්‍ර දේවේන්ද්‍රයා තම මාතලී රථාචාර්ය සමග අහසින් ගමන් කරන අවස්ථාවක ශක්‍ර දේවේන්ද්‍රයා මිනිස් ලොවට වඳිනු ආකාරයක් තම මාතලී රථාචාර්යවරයා දුටුවේය. පසුව එයට හේතුව කිමැයි ඇසූ කල,

"යේ ගහට්ඨා පුඤ්ඤකරා
සීලවන්තා උපාසකා
ධම්මේන දාරං පෝසෙන්ති
තං නමස්සාමි මාතලී"

"මාතලිය, මෙම මිනිස් ලොව සමහරෙක් අඹු දරුවන් පෝෂණය කරමින්, යුතුකම් ඉටුකරමින්, සිල්වත්ව ජීවිතය රකින්නේය. මාගේ වැඳුම ඔවුන් සඳහා" යැයි යනුවෙන් ශක්‍ර දේවේන්ද්‍රයා පිළිතුරු දුන්නේය. එයින් පැහැදිලි වන්නේ දෙවියන්ට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයාගේ පවා වැඳුම් පිදුම් මිනිස් ලොව සිල්වතුන්ට ලැබෙන බව නොවේද?

කොබෙයිගනේ පුබ්බිල්ලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙණේ ආචාර්ය
ගලගෙදර රතනවංශ හිමි

# සැරියුත් හාමුදුරුවෝ

## දානය ගැන කී මේ කතාව


### අදටත් කොතෙක් ගැළපෙනවාදැයි බලන්න

එක් කාලයක අපේ සැරියුත් මහරහතන් වහන්සේයි, මුගලන් මහරහතන් වහන්සේයි තමන්ගේ පිරිවර භික්ෂූන් වහන්සේලා දහසක් සමග බුදුහාමුදුරුවන්ගේ අවසරය මත ජනපදචාරිකාවේ වඩිනවා. එහිදී උන්වහන්සේලාට උපාසකවරු පිරිසක් දන් පැන්වලින් ඇප උපස්ථාන කරනවා. මේ එක් අවස්ථාවක සැරියුත් මහරහතන් වහන්සේ අනුමෝදනා බණක් දේශනා කරනවා. අනුමෝදනා බණක් කියන්නේ දන් වළඳලා අවසානේ කරන ධර්ම දේශනාවටයි. ඉතින් මේ දේශනාවේදී සැරියුත් හාමුදුරුවෝ ඉතා පැහැදිලි වැදගත් කරුණු කීපයක් දේශනා කරනවා දන්දීම ගැන. ඒක ඔබටත් ඉතා වැදගත් වෙනවා.

1. මේ පුද්ගලයෙක් තමන් ඉතා හොඳින් දන් දෙනවා. නමුත් වෙන කාවවත් ඒකට සම්බන්ධ කරගන්නේ නැ. තනියම ඒ වැඩේ කරනවා. එයාට භව ගමනේදී භෝග සම්පත් හොඳින් ලැබෙනවා. නමුත් පිරිවර සම්පත් ලැබෙන්නේ නැ.

2. මේ පුද්ගලයෙක් අනුන් දීම සඳහා පොළඹවනවා. ඒ අය දන් දීම සඳහා සම්මාදන් කරනවා. නමුත් තමන් දෙන්නේ නැ. එයාට භව ගමනේදී භෝග සම්පත් ලැබෙන්නේ නැ. නමුත් පිරිවර සම්පත් හොඳින් ලැබෙනවා.

3. තවත් එක්කෙනෙක් තමන් දෙන්නෙත් නැ, අනුන්ට දෙන්න දෙන්නෙත් නැ. ඒ අයට මේ භව ගමනේදී භෝග සම්පත් ලැබෙන්නෙත් නැ, පිරිවර සම්පත් ලැබෙන්නෙත් නැ.



4. හතරවෙනි පුද්ගලයා තමනුත් දන් දෙනවා, අනුන්වත් ඒකට සම්මාදම් කරගන්නවා. එයාට මේ භව ගමනේදී භෝග සම්පත් වගේම පිරිවර සම්පත්තියත් හොඳින් ලැබෙනවා.

මේ පුද්ගලයෝ හතරදෙනාගෙන් වඩාත්ම හොඳ හතරවෙනි පුද්ගලයා. නමුත් මම හැමදාම පුද්ගලයෙක් වෙනුවෙන් මිනිහු කොටසකට අයිති වෙන්න සම්බන්ධ වෙන්න පුළුවන්. ඒකත් තියෙන්නකෝ මේ පිරිවර සම්පත්තිය කියන්නේ හරි පුදුම සම්පතක්. අපේ මරණයක් මඟුලක්, හදිසි වෙලාවක මේ මිනිස්සු නැතනම් අපට පිරිසක් ඉන්නවා නම් කොච්චර හොඳද? අපි අසනීපයක් හැදිලා රෝහලේ හතරවෙලා ඉන්නවා කියලා හිතන්න. අපව බලන්න කවුරුවත්ම එන්නේ නැත්නම් අපේ හිතට ඒක බලපානවා. තමන්ගේ කරදරයකදී කවුරුවත් නැත්නම් ඒක අපට දරාගන්න අමාරුයි. අපට පිරිවර සම්පත් නැතුව බැ. අපි කොච්චර කිව්වත් මට කවුරුවත් ඕන නැ කියලා සමහර අවස්ථාවලදී අපට තනියම ප්‍රශ්න දිනන්න බැරි වෙලාවල් එනවා. පිරිස නැතුව බැරි කැන් එනවා. අනේ මේ වෙලාවට පිරිස දෙනෙක් හිටියා නම් කොච්චර හොඳද කියලා. ඒ නිසා අපි රුවුකාර මනුස්සයෝ සිතුණු ජාතියක් උපදින්නේ. අපට මේ නිසා පිරිවර සම්පත් ඕන වෙනවා. ඒක ලබන්න වාසනා ගුණයක් තියෙන්න ඕන. ඒ සම්පත ලැබෙන්නේ අර හතරවැනි පුද්ගලයාටයි. ඉතින් මේ පුද්ගලයන් හතරදෙනා ගැන සැරියුත් හාමුදුරුවෝ කරපු ධර්ම දේශනාව අහගෙන හිටපු අර උපාසක පිරිසේ එක් උපාසකයෙක් භෝග සම්පත් පරිවාර සම්පත් දෙකම ලැබෙන දානයක් දෙන්න තීරණය කරලා සැරියුත් හාමුදුරුවන්ට දානයට ආරාධනා කරනවා. සැරියුත් හාමුදුරුවෝ ආරාධනාව භාර අරගෙන හාමුදුරුවන් වහන්සේලා දහසක් වැඩ සිටින බවත් දැනුම් දෙනවා. ඊට පස්සේ අර උපාසකයා ගම හැම තැනම ඇවිදිමින් සියලු දෙනා ඒ දානයට සම්මාදම් කරගන්නවා. දානය ඉතා හොඳින් සංවිධානය වෙනවා. මේ අතර එක් කුල පුත්‍රයෙක් ලක්ෂයක් වටිනා සුවඳ හඳුන කැබැල්ලක් අරගෙන තමනුත් මේ පින්කමට සම්බන්ධ වෙන්න ඕන කියලා හිතාගෙන අර උපාසකයා මුණ ගැහිලා දානේ වෙනුවෙන් හරි අඩුපාඩුවක් තියෙනවා නම් මේක විකුණලා ඒ අඩුපාඩු අරගන්න. එහෙම අඩුපාඩුවක් නැති වුණොත්


නැමැති හාමුදුරු නමකට පූජා කරන්න කියලා මේ වටිනා කසාවත දීලා යනවා. දැන් කිසි අවුපාඩුවක් තිබුණේ නැති නිසා කසාවත පිළුණුවේ නෑ. දැන් මේ කසාවත කාටද පූජා කරන්නේ කියලා කතාබහක් ඇතිවෙනවා. දැන් ගෙදර එක එක්කෙනා එක එක අදහස් කිව්වා. සමහරු කිව්වා සැරියුත් හාමුදුරුවන්ට පූජා කරමු කියලා. සමහරු කිව්වා දේවදත්ත හාමුදුරුවන්ට පූජා කරමු කියලා. හැබැයි මෙතෙනදී වැඩි පිරිසක් කැමති වුණේ දේවදත්ත හාමුදුරුවන්ට පූජා කිරීමයි. ඒ නිසා වැඩි කැමැත්ත මත මේ කසාවත දේවදත්ත හාමුදුරුවන්ට ලැබෙනවා. දේවදත්ත හාමුදුරුවෝත් මේක පරිහරණය කරනවා.

අනතුරුව නැවතත් සියලු භික්ෂූන් වහන්සේලා සැවැත්නුවරට වැඩම කරනවා. දැන් මේ සිවුරේ කතාව භික්ෂූන් වහන්සේලා අතරත්, ගිහි අය අතරත් කතාබහට ලක්වෙනවා. සමහරු කිව්වේ දේවදත්ත හාමුදුරුවන්ට මේ සිවුර කොහොමටවත් ගැළපෙන්නේ නෑ කියලා.

දේවදත්ත හාමුදුරුවන්ට ඒක ලැබෙන්න හේතුව උන්වහන්සේ ගිහියන්ගේ සාමාන්‍ය කටයුතුවලදී අනිත් හාමුදුරුවන්ට වඩා ළඟින් හිටියා. හිතේ ලොකු කපටිකමකින් මිනිස්සුන්ට ළංවෙලා හිටියා. බුදුහාමුදුරුවෝ ඝාතනය කරලා නායකත්වයට පත්වෙන්නයි දේවදත්ත හාමුදුරුවන්ගේ හිතේ තිබුණේ. මේ නිසා නිතරම ගිහි අයට ළංවෙලා ඇඟ එහාට ඒමේ පිපාසෙකින් දේවදත්ත හාමුදුරුවෝ කටයුතු කළා. ඒ නිසා ඒ මිනිස්සු ඒ හාමුදුරුවෝ ගැන පැහැදිලා තමයි සිවුර දුන්නේ. නමුත් දේවදත්ත හාමුදුරුවෝ කොහොමත් දුෂ්ට වැඩ කරන කෙනෙක් කියලා අනිත් අත්තෝ දන්නවා. ඒ නිසා සැරියුත් හාමුදුරුවන්ට ඒ සිවුර වඩාත් ගැළපෙන බව හැමෝම කියන්න පටන් ගත්තා.


කොහොම හරි මේ කතාව බුදුහාමුදුරුවන්ගේ ළඟටත් ගියා. බුදුහාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා. දේවදත්ත නොගැළපෙන සිවුරු පරිහරණය මේ ආත්මෙදී විතරක් නෙමෙයි ඉස්සරත් කරලා තියෙන බව. එහෙම කියලා භවයෙන් වැසිච්ච ඒ කතාව භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා.

ඒ අතීත කතාවට අනුව දේවදත්ත හාමුදුරුවෝ ඒ ආත්මේ වැද්දෙක්. එයා කැලෑවේ ඉන්න ඇතුන් මර මරා දළ, නිය, මස් ආදිය විකුණමින් ජීවත් වෙනවා. දවසක් මෙයා දකිනවා පසේ බුදුරජාණන් වහන්සේ නමකට මහා ඇත් පිරිසක් නැමී නැමී වන්දනා කරනවා. වැද්ද කල්පනා කරනවා මේ ඇතුන් අල්ලගන්න ලේසිම ක්‍රමය මේ වගේ සිවුරක් ඇඳගන්න එක කියලා. ඒ අනුව මෙයා දවසක් පසේ බුදුහාමුදුරුවෝ නාන වෙලාවක ඉවුරට ඇවිත් සිවුරක් හොරකම් කරගෙන ගිහින් ඒකත් ඇඳගෙන ඇත්තු පෙළ ගාව රැකගෙන ඉන්නවා. අනේ ඇත්තුන් මෙයාට නැමී නැමී වඳිනවා. මෙයා මොකද කරන්නේ. අන්තිම ඇතා වඳින කොටම දරුණු ආයුධයකින් පහරට ගහලා ඒ ඇතා මරාගන්නවා. මෙහෙම කාලයක්ම මේ වැඩේ කරනකොට තම රැළේ ඇතුන් එක එකා අඩු වන බව නායක ඇතාට තේරෙනවා. නායක ඇතාට සැක හිතිලා දවසක් මේ ඇතා කණ්ඩායමේ පිටුපසින් එනවා. එදත් වැද්ද ආයුධයෙන් ගැහුවා. නායක ඇතා අනතුර ගැන දැනගෙන ආපු නිසා බේරුණා. පිටුපස්සේ ඇතා මෙයාව අල්ලගන්න හදනකොට ගහට මුවා වුණා. නායක ඇතා ගහ වටකරලා හොඬවැල දාලා ගහත් එක්කම වැද්දව අල්ලා ගත්තා. වැද්දට බේරෙන්න විදියක් නැති නිසා අර සිවුරු කොන ඇතාගේ පැත්තට දික්කෙරුවා. ඇතා වැද්දව නොමරා අතහැර දැම්මා. මේ කතාව කියලා බුදුහාමුදුරුවෝ ඉතා ගාථා දෙකකත් අර භික්ෂූන් වහන්සේලාට ධර්මය දේශනා කරනවා. දේවදත්ත හාමුදුරුවන්ට විතරක් නෙමෙයි කාටවත් එවැනි සිවුරු පරිහරණය හොඳ නැති බව මේ ධර්මයෙන් දේශනා කෙරෙනවා. සිවුර විතරක් නෙමෙයි ඕනම ඇඳුමක් පටන් කෙනෙක්ව රවටන්න නම් අඳින්නේ ඒක ඉතා නරක බව මේ ධර්මයෙන් අපට කියා දෙනවා.



**පූජ්‍ය යටමලගල**
**සුමනසාර හිමි**
**දහම් හඬ අන්තර්ජාතික බෞද්ධ**
**මධ්‍යස්ථානය, පරිට්ටිවිල, කැලණිය.**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය"




දේශකයාණෝ - ඝාණමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ
පූජ්‍ය තිඹිරිවාවේ ශ්‍රී සිද්ධාර්ථ
ක්ෂේමංකර හේවාවිතාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

# කලණ මිතුරු ඇසුර

## දෙලොව යහපත පිණිස වේ

"පූජකො ලභතෙ පූජං - වන්දකො පටිවන්දනං,
යසො කිත්තිඤ්ච පප්පොති - යො මිත්තානං න දුභති"

"යමෙක් මිතුරන්ට පුදනු ලබන්නේ නම් තමා ද පිදුම් ලබන්නේය. බුද්ධාදී කල්‍යාණ මිත්‍රයන් වඳින තැනැත්තා පුනර්භවයක දී ප්‍රතිවැඳුම් ලබන්නේය. යසසට හා කීර්තියට ද පැමිණෙන්නේය. යමෙක් මිතුරන්ට හිතවත් නම් මේ සියල්ල ලබයි."

(මිත්තානිසංස)

පින්වත්නි,

අද මැදින් මස පුර පසළොස්වක පොහොය දිනයයි. සම්බුද්ධ ශාසන ඉතිහාසයේ, පෙර සියලු බුදුවරයන් වහන්සේ සිදුකළාක් මෙන්, අප ගෞතම සම්මාසම්බුදුරජාණන් වහන්සේ ද ප්‍රවේණිවංශ චාරිත්‍රය ඉටුකිරීම සඳහා ඥාති සංග්‍රහය පිණිස තමන් වහන්සේගේ ජන්මභූමිය වූ කිඹුල්වත්පුරයට වැඩම කිරීම ආරම්භ කළේ අද වැනි උඳුම් මැදින් පුන්පොහෝ දිනයකයි. අප ගෞතම සම්මාසම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර බිම්බිසාර රජු පූජාකළ වේළුවන විහාරයේ වැඩවාසය කරන බව දැන, සුද්ධෝදන පිය මහරජතුමා පුත්‍ර ස්නේහයෙන් යුතුව, බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩම්මවාගෙන එන ලෙස අමාත්‍යවරු නවදෙනෙකු සමග නවදහසක් රාජපුරුෂයන් නව වාරයක් රජගහනුවරට යැවූහ. එසේ ගිය සියලු දෙනාම එහිභික්ෂු භාවයෙන් මහණව රහත් වැඩවාසය කළාහුය. බුදුරජාණන් වහන්සේ අද අද කිඹුල්වතට වඩිතැයි බලා සිටි සුද්ධෝදන පිය මහරජතුමා දසවන වාරයෙහි බෝසතුන් සමග එකදා උපන් කාළුදායි නම් ඇමැති කැඳවා, දහසක් රාජපුරුෂයන් සමග රජගහනුවරට ගොස්, කිඹුල්වතට බුදුරජාණන් වහන්සේ වැඩම්මවාගෙන එන්නැයි ඉල්ලා සිටි බව, කාළුදායි ඇමැති තමාට ද පැවිදි වීමට අවසර ඉල්ලීමෙන් පිට අවසර ලබාදී, බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩම්මවාගෙන එනම් වශයෙන් කාළුදායි ඇමැතිවරයාට භාරදෙන ලදී. එම ගොස් පැවිදිව රහත්බව ලැබූ කාළුදායි මහරහතන් වහන්සේ, පිය මහරජතුමන් පුත්‍ර ස්නේහයෙන් යුතුව බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම්මවාගෙන එන ලෙස තමන්ගෙන් ඉල්ලා සිටි බව දන්වා සිටියෙන්, බුදුරජාණන් වහන්සේ යොදුන් සැටක් පමණ මග ගෙවා කිඹුල්වතට වැඩම කිරීමට ගමන් ආරම්භ කළේ අද වැනි මැදින් පුර පසළොස්වක පොහොය දිනයකයි. එසේ වැඩම කරවීමෙන් අනතුරුව ඥාතීන්ගේ මානය බිඳ දමා, පිය මහරජු සෝවාන්ඵලයේ පිහිටුවා, යශෝධරාවන්ගේ ගුණ වර්ණනා කර, නන්ද කුමරු, රාහුල කුමරු ආදීන් පැවිදි කරවා ශාසනික ප්‍රබෝධයක් ඇතිකළ සේක.

මෙබඳු උඳුම් පුන්පොහෝ දිනයක දී කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර ලබා ගැනීමේ වටිනාකම පිළිබඳව තරුණ දැනැත්තන්, තරුණ, මහලු සැමදෙනාගේ යහපත පිණිස වන මැදින් අද දින ධර්ම දේශනාව තුළින් කල්‍යාණ මිත්‍ර ඇසුරේ වැදගත්කම විස්තර කර දීමට අදහස් කළෙමි.


බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල දී කරන ලද දේශනා තුළින් කල්‍යාණ මිත්‍ර සම්පත්තියේ ඇති වැදගත්කම විස්තර කර දී ඇත. විශේෂයෙන් සිඟාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, මෙත්තානිසංස ආදී දේශනාවන්හි යහපත් මිත්‍රයන් ඇසුරේ ඇති වැදගත්කම මනාව විස්තර වේ. කල්‍යාණ මිත්‍රයෙකුගේ වටිනාකම මෙපමණයැයි කියා නිම කළ නොහැකි තරම් බව ආනන්ද තෙරුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ වදාළ කරුණකින් පැහැදිලි වේ. වරෙක ආනන්ද තෙරුන් වහන්සේ බුදුසසුනින් ලැබෙන දියුණුවෙන් අඩක් පමණ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය නිසා ලැබෙන බව පැවසූ

අවස්ථාවේ, බුදුරජාණන් වහන්සේ ආනන්දය, අඩක් නොව, මුළු සසුනත් මුළු දියුණුවටම හේතු වන්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තියම යැයි දේශනා කොට වදාළ සේක. මෙමගින් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය අමිල වටිනාකමින් ඇති සම්පත්තියක් ලෙස සලකා ගත හැකිය.

තමා ඇසුරු කරන මිතුරාට යහපත සැලසීමේ අදහසින්, හිතවත්ව, ජනෝපකාරීව කටයුතු කරන, අයහපත්, අවැඩදායක හසුරු දැයින්, පාපයෙන් වළක්වා ආරක්ෂා කරගන්නා තැනැත්තා කල්‍යාණ මිත්‍රයා වශයෙන් සැලකේ. දුක සැප දෙකෙහිදීම එකට එක්ව සහය වන්නා යහපත් මිත්‍රයෙකි. නරක මිත්‍රයෝ ඇසුරෙන් තමන්ට නපුරක්, පාපයක්ම සිදුවේ. ඔහු ප්‍රිය කරුණකදී තමා අමතක වී හිත යට කුහක කම ගෙන ස්වාර්ථයෙන් හැටි හැටි සිටිති. හොඳ මිතුරෝ එසේ නොවෙති. රන් කළයක් මෙන් නොබිඳෙන ගතිගුණ ඇත්තෝය. හොඳ මිත්‍රයෙක් ලේසියෙන් ඡේද කිරීමට නොහැකිය. අමිතුරුවෙන් ඡේද වුවත් නැවතත් ඉතා පහසුවෙන් සමගි වී හිතේ කැටක් නැතිව මිත්‍රකම දිගටම පවත්වාගෙන යන්නෙක් වෙයි. හොඳ මිත්‍රයෝ පුංචි තැනදී නොසිතුරුව උපකාරී වෙති. සැපතේදී මෙන්ම විපතේදී ද තම මිතුරා අත් නොහරින්නේය. එපමණක් නොව තම මිතුරා පාපයෙන් වළවා මෙලොව පරලොව දෙකෙහිම යහපත පිණිස මඟ කියාදෙන්නේය. එසේම ඇසුරු කිරීමේ දී තම මිතුරාගෙන් වරදක්, ප්‍රමාද දෝෂයක් සිදු වුවත් එය සිත තුළ පැසව පැසවා තබා නොගෙන අනුකම්පාවෙන් නැවත එක්ව කටයුතු කර, ඔහු අකුසලයෙන් පාපයෙන් මුදවා ගැනීමට කටයුතු කරයි. නොමසුරු සිතින් ඉතා වටිනා දෙයක් වුවද තම මිතුරා වෙනුවෙන් දීමට හෝ ඉතා අමාරු දෙයක් ඉටුකිරීමට හෝ මැලිකමක් නොදක්වයි. වැරදීමකින් හෝ වරදක්, කිසිමක් සිදුවුවහොත්, දොස්පරොස් රළු බසක් කියැවුණෙත් එය ඉවසා සිටියි. කිසිම විපතක දී ඔහු තම මිතුරා අත්නොහරින්නේ නැත. ධනය නැති වී දුප්පතෙකු වූ අවස්ථාවකදී වුවද ඔහු අත්නොහැර ඇසුරු කරයි. තමාට හැකි පමණින් ඔහුට උපකාරී වෙයි. කරුණාවෙන් සලකයි.

මෙත්තානිසංස සූත්‍ර දේශනාව අනුව යම් පුද්ගලයෙක් තම මිතුරාට ද්‍රෝහිකම් නොකරයි නම් ඔහු තමාගේ ගෙයින් බැහැර යම් තැනක කන බොන ආහාර හිඟ නොවෙයි. ඒ මිත්‍ර පූජකයා ඇසුරු කොට බොහෝ දෙනෙක් ජීවත් වෙති. යමෙක් මිතුරාට ද්‍රෝහිකම් නොකෙරේ නම් ඔහු යම් රටකට ගියත්, නියම් ගමකට ගියත්, නුවරකට ගියත්, ඒ හැම තැනකදීම අනායාසයෙන් පිදුම් ලබයි. යමෙක් තම යහළුවාට සුවය ඇති කෙරේ නම් ඔහු වෙත සොර සතුරෝ ළං නොවෙති. රජවරුන්ගේ අවමානයට ලක් නොවේ. හැම සතුරෙක්ම දුරු කෙරෙති. යමෙක් මිත්‍ර ද්‍රෝහී නොවී මිතුරන්ට යහපත් වී සිටී නම්, ඔහු සුවසේ ගෙදරට ආපසු පැමිණෙයි. සභාවෙහි සතුටු වෙයි. නෑයන්ට උතුම් වෙයි. යමෙක් මිත්‍ර ද්‍රෝහී නොවේ නම්, අනුන්ට සත්කාර කොට තමන් ද සත්කාර විඳිනු ලබයි. අනුන්ට ගෞරව සහිතව සිට තමන් ද ගෞරව ලබයි. වර්ණ, කීර්ති, ප්‍රශංසා දෙකම ලබයි. දිළිසෙන ගිනි මෙන් ඉසුරුවන්තකමින් දිලුළන්නේය. දෙවියෙකු මෙන් බබලන්නේය. ශ්‍රීයාව අත් නොහරින්නේය. යමෙක් මිතුරන්ට විශ්වාසීව සිටින්නේ නම්, තුම්කින් ඇදවැටුණත් ඔහුට පිහිට ලැබෙන්නේය. යමෙක් ප්‍රහව සිටී නම් ගවයන්ගෙන් ඔහුට ඵල ප්‍රයෝජනය ලැබේ. කෙතෙහි වපුරන සාක් දැයින් ඵල ඇති අස්වැන්න ලැබෙයි. දරුසැප නොඅඩුව ඇතිවෙයි.

කල්‍යාණ මිත්‍ර ඇසුරෙහි ඇති අගය විස්තර කෙරෙන ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ මැනවින් විස්තර වන පරිදි සැදැහැවත්ව, සිල්වත්ව, ත්‍යාගශීලීව, නුවණැතිව, ගුණගරුකව, එක්ව වාසය කරන, එක්ව කටයුතු කරන, එක්ව කතාබස් කරන අයගේ ඇති සැදැහැවත් ගතිගුණ අනුව හැඩගැසේ ද එය කල්‍යාණ මිත්‍රතාව ලෙස සම්බුද්ධ දේශනාවේ දැක්වේ. කෙනෙකුගේ මෙලොව, පරලොව දෙකෙහිම දියුණුව පිණිස කල්‍යාණ මිත්‍රයා තරම් වැදගත් වන කෙනෙක් ලෝකයේ නැති තරම්ය. මෙලොව පිරී සිටින්නේ පාපී මිත්‍රයන් බැවින් නියම කල්‍යාණ මිත්‍රයෙකු සොයාගැනීම නම් ඉතාම අසීරුය. යම්කිසිවෙකු ටික පමණින් හෝ කතාකළ පමණින් ඔහු හොඳ කෙනෙකු ලෙස සලකා ඇසුරට ගැනීමට සුදුස්සෙකු ලෙස සිතීම අනුවණකම කාරණයක් නොවේ. බොහෝ අයගේ පිටින් පෙනෙන ගතිගුණ, කාන්තදායකකම්



අභ්‍යන්තර ජීවිතයේ නැත. රැවටිලිකාරයන්ගෙන් මෙලොව පිරී ඇති බැවින්, ඇසුරට ගැනීමට කෙනෙක් තෝරාගැනීමේ දී හොඳින් සොයා බලා [illegible] නියම සුදුස්සෙකු තෝරාගැනීමට කටයුතු කළ යුතුය.


ශෛශව, ළමා, [illegible], සතුරු උපද්‍රව, බිය යන මේ සියලු විපත්තීන්ගෙන් කෙනෙක් රැකගන්නට සමත් ප්‍රීතිය, විශ්වාසය යන ගුණවලට හේතුවන මිත්‍ර සම්පත්තිය තුමන අනිත් බැදුවත් වැදගත් බව පෙනේ. ඉතා ළාබාල කුඩා අවධියේ වුවත්, තරුණ අවධියේ වුවත්, මහලු අවධියේ වුවත් මිතුරන්ගේ ඇසුර අත්‍යවශ්‍යය. ඒ හැම අවස්ථාවකදීම ගුණයෙන් හා නුවණින් යුතු මිතුරන් ඇසුරට ගැනීමට වගබලා ගත යුතුය. ඉතාම කුඩා අවධියේ පටන් අප ඇසුරෙහි සිටින මව, පියා තරම් සුදුසු මිතුරෙක් තවත් නැත. පාසල් වියේදී දෙමව්පියන්ට අමතරව ගුරුවරු ද අපේ යහපත් මිතුරෝ ලෙස සැලකිය හැකි වෙති. තරුණ වියට පත්ව විවාහ වූවාට පසු අඹුසැමියන්ට ඔවුනොවුන් මිතුරන් සේ කටයුතු කළ හැකිය. ඒට මාගීරීන් තෝරා ගන්නා සියලු දෙනා කල්‍යාණ මිත්‍රයෝම විය යුතුය. පාපී දුර්ගුණ ඇති මිතුරන් තෝරා ගැනීමෙන් සිදුවන විපත්තිය, පිරිහීම කියා නිමකළ නොහැකිය. ගුණ නුවණින් අඩු බාලයන් ඇසුරු කිරීමෙන් තමන් මගේ අගාධයකට ඇද වැටී පිරිහේ. අසත්පුරුෂ ආශ්‍රයෙන් ඇතිවන දුක් දොම්නස් බොහෝය. කල්‍යාණ මිත්‍රයෙකු ඇසුරු කරන්නට ලැබුණොත් එය ජීවිතයට අගනා සම්පතින් පිරුණු නිධානයක් ලැබුණක් වැනිය.

අපේ ඇසුරට යොදා ගන්නා මිතුරන් ආකාර වශයෙන් සිවදෙනෙකි. එනම් ආපදාවක දී උපද්‍රවක දී තමන්ට උපකාර කොට ආරක්ෂා කරගන්නා තැනැත්තා උපකාරක මිත්‍රයාය, තමන්ගේ රහස් සඟවා එය අනුන්ට නොකියා රැක ගෙන විපතේ දී පිහිට වන, මිත්‍රයාට අභිවෘද්ධිය සලසන තැනැත්තා සමානසුඛදුක්ඛ මිත්‍රයාය, හොඳ නරක තේරුම් කර දෙමින්, දුශ්චරිතයෙන් මුදවා, සුචරිතයෙහි පිහිටුවා, දහම් කරුණු අසන්නට සලස්වා යහපතෙහි පිහිටුවන තැනැත්තා අත්ථක්ඛායී මිත්‍රයාය. යහළුවාගේ හා ඔහුගේ අඹුදරුවන්ගේත්, එම පවුලේත් විපතක දී එකට දුක්වන, වැඩිදියුණුවේ දී සතුටුවන, යම්කිසිවකු විසින් මිතුරාගේ අගුණ කියන විටෙක දී සත්‍ය තත්ත්වය විස්තර කොට මිතුරා රැකගන්නා තැනැත්තා අනුකම්පක මිත්‍රයාය යනුවෙන් ඒ සතර ආකාර මිතුරන් හඳුන්වාදිය හැකිය.

සිඟාලෝවාද සූත්‍රයේ දුරුකළ යුතු මිතුරන් වශයෙන්, සැබෑ හිතවත්කමින් නොව, යමක් තමන්ගෙන් ලබාගැනීමේ අරමුණෙන් පැමිණෙන මිතුරන්, බොරුවෙන්, ප්‍රශංසාවෙන් මුළා කෙරෙන මිතුරන්, යහළුවාගේ අදහස් කෙබඳුදැයි බලා බොරුවෙන් සිත සතුටු කරවීමට පමණක් කරුණු කීමට සිතන මිතුරන්, විනාශය ඇති කරන මිතුරන් යන අය මැනවින් හඳුනාගෙන දුරින්ම දුරුකළ යුතුය. තමන්ගෙන් යමක් ප්‍රාර්ථනා කිරීමට පමණක් එන මිතුරා නියම මිතුරෙක් නොවේ. තමන්ට උදව්වක් අවශ්‍ය අවස්ථාවේ එය පැහැර හරින මිතුරා ද මිතුරෙක් නොවේ. යහපත් මිතුරුකම ගනුදෙනුවක් හා සමානය. නියම මිතුරුකමේ දී ගැනීමට මෙන්ම දීමට ද පුරුද්දක් තිබිය යුතුය. එසේම සුළු දෙයක් දී ලොකු උපකාරයක් බලාපොරොත්තු වන මිතුරන් ද නියම මිතුරන් නොවේ. එය හරියට සුළු ඇමක් දී මාළුවන් අල්ලා ගන්නවා වැනි කරුණකි.

සිතෙන්, වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන් ද, සැපේදී මෙන්ම දුකේදී ද වෙනසක් නොවී හද පතුලෙහි කාවැදී තිබිය යුතු බැඳීමෙන් යුතුව පවත්වාගෙන යන මිතුරුකම දෙපාර්ශ්වයටම වඩාත් හිතකරය. මිත්‍ර රූපයෙන් පෙනී සිටින රූකඩ මිතුරන් දැනගෙන කටයුතු කිරීම බොහෝ වැදගත්ය. අවංක සිතින් පිටකරන වචනය, රෝග යන දී අණදෙන බෙහෙත් වැනිය. තම මැලිකමින් විර්යවන්ත බවටත්, අසමඟියෙන් සමඟි බවටත්, නොඉවසීමෙන් ඉවසීමටත්, පිරිහුණු බවින් දියුණුවටත්, එතිගෙනයාට උපකාර කරගන්නා අප නියම කල්‍යාණ මිත්‍රයෝය. එසේ හෙයින් මේ කුමන වයසක සිටියත්, ප්‍රඥාවෙන් කල්‍යාණ මිත්‍ර ඇසුරම ඇතිකර ගැනීමට අදිටන් කර ගනිමු.

# බන්ධනමෝක්ඛ ජාතකයෙන් හෙළිවන ස්ත්‍රී රාගයෙන් මිදීමේ අනුහස්



සසර දුකින් පැටලුණා වූ සියල් ලෝසතුනට අමාමෑණී කෙනෙක් බඳු වූ, දහම් අමාදහරින් ලෝසතුන් තැනැවූවා වූ, අපගේ සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩවෙසන කල්හි චිංචමානවිකාව මුල් කොට මෙම බන්ධනමෝක්ඛ ජාතකය දේශනා කොට වදාළ සේක.

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු, රජ කරන සමයෙහි ඒ රජුට ප්‍රිය වූ බෝධිසත්වයන්වහන්සේ රජුගේ පුරෝහිතයන් වහන්සේ වශයෙන් විසූහ. ඒ රජතුමා අගමෙහෙසියට අධික ලෙස ප්‍රේම කළ නිසා, ඇය කෙරෙහි ස්නේහයෙන් ප්‍රසාදව ඇයට කැමති වරයක් ගන්නැයි බිසවගෙන් ඉල්ලා සිටියේය. එවිට බිසව මට කුමක් අඩු නිසා රජතුමාගෙන් වරයක් ඉල්ලන්නෙම් ද? එහෙත් එකම එක වරයක් මට ලබා දුන මැනවි. එනම් මා හැර වෙනත් කාන්තාවක් දෙස රාග සිතින් නොබලන්නේයැයි සපථ කොට මට වරයක් දෙන්නැයි ඉල්ලා සිටියාය. එවිට රජතුමා තමාට දොළොස්දහසක් පුරාංගනාවන් සිටිද්දී එබඳු වරයක් දීමට නොහැකි බව කීවත්, බිසොවුන් වහන්සේ නැවත නැවතත් එයම ඉල්ලා සිටියාය. අවසානයේ රජතුමාට බිසොවුන් වහන්සේගෙන් ගැලවීමක් නොවූයෙන් රජතුමා එතැන් පටන් වෙනත් ස්ත්‍රියක් කෙරෙහි රාගසිතින්ව නොබලන බවට ඇයට පොරොන්දු වූයේය.

මේ අතර අසල ජනපදයක සතුරු බිය ඇති වූ නිසා ඒ රට පාලනය කළ ඇමැතිවරයාට ඔවුන් ජයගැනීමට නොහැකි බව කීවෙන්, රජතුමා සෙනග රැස් කරවා සටනට යාමට පිටත් වීමට පෙර අගබිසව වෙනුවා සටන් බිමෙහි කිසියම් බියක් ඇති වුව හොත් ස්ත්‍රීන් සමඟ යාමෙන් ඉක්මනින් ගැලවී යාගත නොහැකිය. ඒ නිසා ඔබ මෙනුවර නවත්වා යාමට සිතමි යැයි පවසන ලදී. එවිට බිසොවුන් වහන්සේ රජුට යොදුනෙන් යොදුනට මා ගැන විමසා එවන්නැයි කියා ගමන යාමට අවසර දුන්නාය. අනතුරුව බිසොවුන් වහන්සේට රැකවල් ලවා, පුරෝහිත බමුණානන්ට තමා එනතුරු සියල්ල රැකබලා ගන්නැයි අවවාද දී යොදුනෙන් යොදුනට රාජ සේවකයෙකු වශයෙන් මෙහෙකරුවෙකු

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් මිදුන් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

තොරතුරු දන්වා එවන ලදී.


ඒ මෙහෙකරුවන් ආ විට සිබිලා ආවේ ඇයි දැයි විමසා, සිබතුමියගේ සුවදුක් විචාරන්ට රජතුමා එවූයේ යැයි කී විට, සිසව ඔවුන් පොළඹවාගෙන ඔවුන් සමග ලෝකාස්වාද රතියෙහි යෙදුනාය. මේ ආකාරයෙන් දෙතිස් යොදුන් මාර්ගයේ පසුකර යන ගමනේ දී රජු විසින් එවන ලද දෙතිස්දෙනා ද, යුද්ධය ජය ගෙන එන ගමනේ දී එවන ලද දෙතිස්දෙනා ද යන සැට සතර දෙනාම සමගම ඒ ඒ අවස්ථාවේ ඔවුන් පොළඹවාගෙන සංවාසයේ යෙදුනාය.

රජතුමා යුද්ධය ජයගෙන තම අගනුවර සමීපයට අවුත් ජයකඳවුරු ස්ථානයේ සිට තමන් ආපසු ආ බව පුරෝහිත බෝධිසත්වයන් වහන්සේට කියා යැව්ය. එවිට බෝධිසත්වයන් වහන්සේ පුරය සරසා රජු පැමිණි පුවත සැලකිරීමට සිසව සිටිනා මාලිගයට ගියේය. සිසව බෝධිසත්වයන්ගේ යහපත් රූමත් බව පිළිබඳ සිත ඇති කර ගෙන තම යහන මත ඉඳගන්නැයි කීවාය. එවිට බෝධිසත්වයන් වහන්සේ විසින් ඇයි දේවීන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ ඉතා රුදන්ය. පරලොවටත් බියින් සියන්නේ රජ්ජුරුවන් විසින් එවන ලද සුසැට දෙනා මෙන් මම මේ සා උස්මහත් වන තුරු පරස්ත්‍රියක් හා රාග වශයෙන් නොබැඳුනෙමි. මෙවැනි පිසක් මට නොකියන්නැයි කියා කීවේය. එවිට සිසව පුරෝහිතයන් වහන්සේ අමතා, එසේ නම් මම ඔබ ගැන රජ්ජුරුවන්ට කියා තාගේ හිස කප්පවමියි කීවාය. එවිට පුරෝහිතයන් වහන්සේ එක ජාතියක තමා අහසක් ජාතියේ හිස් කපනත් එවැනි පාපයක් නොකරමියි කියා නික්ම ගියේය.

එවිට මෙම පාපකාරී පතිවත සිඳගත් සිසව පුරෝහිතයන් වහන්සේගෙන් පලිගැනීමේ චේතනාව ඇතිව කිලිටු වස්ත්‍රයක් ඇඳ, ලෙඩ වූ වේශයක් ගෙන ශ්‍රී යහනෙහිම සිටියාය. රජ්ජුරුවන් ඇවිත් මා විචාළොත් ලෙඩ නිසා වැදහොනා බව කියන්නැයි අනෙකුත් ස්ත්‍රීන්ට කියන ලදී.

බෝධිසත්වයන් වහන්සේ රජුට පෙරගමන් කොට රජු බැහැදැක පිළිගත්හ. රජු මහපෙරහැරින් නුවර පැදකුණු කොට රජගෙට ඇවිත් සිසවුන් නොදැක කොහිදැයි විචාරා, ලෙඩ නිසා ශ්‍රී යහනෙහි සැතපී සිටින බව දැන, එහි ගොස් සිසවුන්ගේ පිට පිරිමැද සුවදුක් කෙසේදැයි දේවියන් පිටත් විචාරණ ලදී. එවිට ඇය පුරෝහිත බමුණා විසින් තමා කී දෙය නොකළ බැවින් මෙසේ විනැයි කීවාය. එවිට රජ්ජුරුවෝ උදහස්ව මාලිගාවෙන් පාතට බැස එතැන සිටි සේවකයන්ට පුරෝහිත බමුණා පිටුතලය හයා බැඳගෙන මරන්නැයි උපදෙස් දුන්නේය. එවිට රාජපුරුෂයෝ බෝධිසත්වයන් පිටුතල තබා බැඳ මරන්නට නික්මුණාහ. එවිට බෝධිසත්වයෝ බිසොවුන් තමා පිළිබඳව කරන ලද අසත්‍ය ප්‍රකාශය සත්‍ය කොට සලකා රජතුමා මෙබඳු දඬුවමක් නියම කරන්නේ යැයි සිතා, ඉක් ගැලවෙන්නට රජතුමාට කරුණු පහදා දෙන්නේ කෙසේදැයි සිතා, රාජපුරුෂයන් අමතා මා වෙනුවෙන් නිධාන කළ බොහෝ සම්පත් ඇත, මෙසේ මැරුවොත් රජතුමාට බොහෝ අලාභ වන බැවින්, රජතුමා ඉදිරියට ගෙනයන්නැයි ඉල්ලා සිටින ලදී.


රජතුමන් ඉදිරියට ගෙනගිය විට රජ්ජුරුවෝ දැක බමුණා ලැජ්ජා භය නැතිව මහු කෙළේ කුමක්දැයි පවසමින්, දේවයන් වහන්ස, මම කිසිදු වරදක් නොකළෙමි. මම ඉතිහියකගේ පවා ප්‍රාණඝාතයක් නොකළෙමි. අනුන්ගේ වස්තුවකින් තණකොළක් හෝ නොගත්තෙමි. පරස්ත්‍රීන් රාග සිතින් නොබැලීමි. රා නොබීවෙමි. ද්වේශ නොකිරීමි. එවැනි මම මහ මෙහෙවර පිණිස එවූ සුසැට දෙනා සිදුකළ දේ නොකළෙමි. එවිට රජතුමා ඒ සුසැට දෙනා ගෙනවිත් විමසූ විට සිදු වූ දෙය විචාරා, එය සැබවැයි දැන බිසව ද ගෙන්වා එය සැබෑදැයි දැයි විමසූ විට, සැබවක් බව කී විට, හැම දෙනාම මරන්නැයි අණ කළේය. එවිට බෝධිසත්වයන් වහන්සේ ඒ හැම දෙනා විසින්ම බිසොවුන් විසින් කී නිසා සිදුකළ වරදක් බැවින් ඔවුන් හැමදෙනා මරණයෙන් ගලවා, ඔවුන්ගේ තානාන්තරවලම සිටීමට සලස්වා, බිසොවුණුත් ගලවා, ගිහිගෙයි සිටීම නිසා මේ සා අවුලක් වූයේ යැයි සිතා නෑසියන් හඬා වැළපෙද්දී බොහෝ සම්පත් අත්හැර හිමාල වනයට ගොස් පැවිදි වූයේය. එහිදී පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි වදාළ සේක. එසමයෙහි බිසව නම් චිංචිමානවිකාවය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. පුරෝහිතයෝ නම් ලෝවතුරා බුදුන් වූ මම ම යැයි වදාරා මෙම බන්ධනමොක්ඛ ජාතකය වදාරන ලදී.



මෙම බන්ධනමොක්ඛ ජාතකය තුළින් අනාවරණය වන පරිදි ස්ත්‍රියක හෝ පුරුෂයෙකු කිසියම් වරදක බැඳුණ හොත් නොවරදවාම රටට හිමි දඬුවම ලැබෙන බවටත්, බෝධිසත්ව පුරෝහිතයා මෙන් වරදෙහි නොබැඳී පරස්ත්‍රීන් සේවනය ආදියෙන් වැළකී සිටීමෙන් අභිමිය හැකි කෘතඥතාව මහත් වටින් වටහාගෙන පඤ්චකාමයෙන් මිදී ජීවිතය යහපතෙහි පිහිටුවා ගැනීමට අධිෂ්ඨාන කරගත යුත්තෝ වෙමු.

ජේ. මීගහකුඹුර

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ"



# කිරි අම්මාවරුන්ට දානයක් දෙන්නේ කොහොමද?

බාල, මහලු, ළදරු, කවරෙකු හෝ වෙනුවෙන් පැවැත්වෙන යම් රෝග නිවාරණයක් සඳහා වූ භාරයක් පත්තිනි මෑණියන් නමින් තම එම භාරය ඔප්පු කිරීම සඳහා කිරි අම්මාවරුන්ගේ දානය සිදු කළ යුතුය.

විවිධ කරදරවලදී අවශ්‍යතාවයන් සඳහාද කිරි අම්මාවරුන්ගේ දානය පැවැත්වේ. ගව පට්ටි පාලනය කරන්නන්, නිවසේ ආර්ථික සංවර්ධනය බලාපොරොත්තු වන්නන්, ව්‍යාපාරික දියුණුව පතන්නන්, කුඹුරු ආදියෙහි ඵලදාව ඉල්ලා සිටින්නන් තමන්ගේ සෑම කාර්යය ඉටුවූ විගස කිරි අම්මාවරුන්ගේ දානය දී සිතට සහනය ලබා ගනිති.

දෙවියන්ගේ ලෙඩ, පාවන රෝග, ඇස්වහ, කටවහ හෝ වස, අංගම්වැඩියා ආදිය සතු වස් දෙස් ඉවත් කර විගස විද්වංශනය කිරීමටද කිරි අම්මාවරුන්ගේ දානය සමත් වේ.

මෙතරම් උත්කෘෂ්ට වූ මෙම දානය පිරිනැමීම සිදු කළ යුත්තේ දේව ශාන්ති කර්මයක් ලෙසින් හෙළ සංස්කෘතික මංගල්‍ය ජීවරසයකි.

සත් පත්තිනි, දෙලොස් පත්තිනි යන ආත්මභාව විවරණයක් සහිත පත්තිනි මෑණියන් පිළිබඳව ලක්දිව ජනතාව අතර පවතින භක්තිය පති භක්තියේ ගෞරවයක් සමඟ සංකලනය වී හට ගැනුණකි. එම ගෞරවය ගෞරවාදරයට පාත්‍ර කොට විශ්වාසනීයත්වය තුළින් ඇතිවූ බැඳීම සිදු වන්නේ කිරි අම්මා දානයෙනි. කිරි දානය, අම්මා දානය, කිරි අම්මා දානය, කිරි අම්මාවරුන්ගේ දානය, කන්නලි දානය, පත්තිනි දානය, සිද්ධ පත්තිනි දානය, කිරි දේව දානය යනුවෙන්ද කිරි අම්මාවරුන්ගේ දානය හැඳින්වේ.

● අති උත්තම දේව කාන්තාවක වූ පත්තිනි මෑණියන් හඳුන්වන වෙනත් නම්ද හඳුනා ගනිමු

පත්තිනිය, මනිමේ කන්නගී, කණක මැණිකා, කණක බීසෝ, කන්නගී, ජද්ධිණී, එකස භාමී, මා පත්තිනි, පත්තිනි දේවිය, අම්මා දේවිය, කිරි අම්මා, කළුම කුමාරි කිරි අම්මා, හළුන් කුමාරි කිරි අම්මා, තපස් පුත්‍රී, වීර පත්තිනි, මහා පත්තිනි, සිද්ධ පත්තිනි, අම දේවිය, දේවස්ත්‍රී, සිරිමා පත්තිනි, ජානකී ආදි නම්වලින්ද පත්තිනි මාතාවෝ හඳුන්වති.

● පත්තිනි මෑණියන්ගේ රූපකාය

රුවින් අගතැන්පත් රත්වන් පැහැ ඇති සුරූපී දෙවඟනකි.

ඉතා දිග - වරලසක් ඇත්තිය.
දකුණු අතෙහි - පුන් කලසක් ඇත.
වමත් අතෙහි - හඬ දෙන සළඹකි.
හිසෙහි - නාග මාණික්‍යයක් දරන්නීය.
ඇහ ඇඳි පළව පුරා - මිණි මුතු දිලිසෙයි.
කන් දෙක දිස්තිමත්ව - (අම වැනි) හිල් මැණික් දෙකකි.
දෙවුර වැලුණු පළව - ඝන රනින් සාදු ඇත.
කෙලට - මුතු මාලා පැළඳ ඇත.
දෙතන - දම් දඟුලින් වසා රනින් සරසවා ඇත.
තර වට - මල් දමාගෙන ඇත.
උරට - සුදු වස්ත්‍රයක් පැළඳී.
දෑතෙම - වළලු හා පාද සිළම්බු.

දේවකත් වශයෙන්ද, දේවාභරණ වශයෙන්ද, දේවරත්නාප වශයෙන්ද හඳුන්වන්නේ පත්තිනි මෑණියන්ගේ ආයුධ වන්නේය.

එම ආයුධ නම්:
තලුව, දුන්න, පළිහ, මුගුර, සෝඩුව, රන් අම වළල්ල.

අභරණ යයි කියන්නේ සළඹ හෙවත් නූපුරය වන්නේය.

● සළඹෙන් කියවෙන කරුණු තුනකි

1. රාජ ධර්මය වරදවා ගත් රජුගේ මාරයා.
2. පති වතාවෙහි අගපත් පත්තිනිය.
3. කර්ම විපාකයේ වල දීම වැළැක්විය නොහැක.



"වෛර සහිතව ජීවත් වන මිනිසුන් අතුරෙහි වෛර රහිතව ඒකාන්තයෙන්ම සුවසේ ජීවත් වෙමු. වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වෙමු."

**● කිරි අම්මාවරු හත්දෙනා වන්නේ:**

1. පොළොව මහී කාන්තාව.
2. මුහුදේ මහී කාන්තාව.
3. සරස්වතී දේවීන් වහන්සේ.
4. සීතා පරමේශ්වරී.
5. මිණිමේඛලා හෙවත් අම්බා දේවිය.
6. වල්ලි මාතාවෝ.
7. පත්තිනි දේවීන් වහන්සේ.

**● දානය සඳහා මෙම්බඳ කාන්තාවන් කැඳවන්න එපා.**

1. ඉතා මහළු කාන්තාවන්.
2. සුව කළ නොහැකි රෝගී කාන්තාවන්.
3. ඇඟ විකල කාන්තාවන්.
4. අන්ධ හෝ බිහිරි කාන්තාවන්.
5. අංශභාග හෝ අපස්මාර රෝගීන්.
6. ළමා දරුවන් මියගිය මව්වරුන්.
7. වැන්දඹු කාන්තාවන් (සැමියා මියගිය).
8. වඳ ස්ත්‍රීන්.
9. මත්ද්‍රව්‍ය හෝ මත්පැන් පානය කරන්නියන්.
10. මස් හෝ මාළු විකුණන කාන්තාවන්.
11. අනුන්ගේ අඩු සොයමින් කේලාම් කියන්නියන්.
12. සොර සැමියන් පසන්නියන් හෝ වෛශ්‍යාවන්.

**● කිරි අම්මාවරුන්ගේ දානය දෙන දිනය.**

බද පිරිසෙයන එක පුර පක්ෂයේ දිනයක් මේ සඳහා යොදා ගත යුතු වේ. එමෙන්ම සඳුදා, බදාදා, සෙනසුරාදා වැනි ශෝභමාන දිනයක් විය යුතුය.

**● දානය දීමට පෙර:**

1. මුලක් කොළ හතක් ගත් මෙහිමියා කිරි අම්මාවරු ගොයා ගෙස් මුලක් කොළය බැගින් දී ආරාධනා කරයි.
2. නිවසේ පිරිස කිලි කුණුවලින් වෙන්වී සිටිය යුතුය.
3. නිවස පිරිසිදු කොට තැබිය යුතුය.
4. සුදු හඳුන් කුඩු, කහ කුඩු, පොල් කිරි දියර එකට කලවම් කර නිවස පුරා පැන් ඉසීම කළ යුතුය.
5. සුවඳ දුම් ඇල්ලිය යුතුය.
6. කිරි අම්මලාගේ පා සේදීමට වතුර බේසමක් තබන්න.

**● සැකසෙන පූජාව:**

1. නිවස ඉදිරිපිට මල් පැලක් තනන්න.
2. නිවසට ඇතුළු වීමට පසුව සෙනෙහ පත්තිනි මල් යහන හදන්න.

**● 1. මල් පැල සෑදීම:**

ගෙක් අත්තකින් සාදන මල් පැලක් කෝටු මත රඳවා ඒ මත මුලක්, පහන් තබා හඳුන්කූරු දල්වන්න. එහි පැන් බඳුනක් අමණක් තබන්න.









**● 2. නිවස තුළ මල් යහන:**

ඉදිරියට තුනක් හා පසුපසට හතරක් වන ලෙස කෝටු තබා එය මල් යහනක් සේ පිළියෙළ කරන්න.

මේසයකට ගැට ගසන ලී කෝටුවලින්ද මෙම යහන සාදාගත හැකිය.

1. පිරිසිදු කළ කෙසෙල් කොළයක් ආසන හැඩයේ එලන්න.

2. ඒ මත මුලක් කොළ දෙළහක් තබන්න. (මුලක් කොළ ත්‍රී මුලක් විය යුතුය.)
3. ලද පස් මල් ඉසින්න.
4. මල් අතුරුවන්න.
5. පිණිදිය ඉසින්න.
6. කපුරු දල්වන්න.
7. හඳුන්කූරු දල්වන්න.
8. පෙර අරක් හැලි භාජන එහි තැන්පත් කරන්න.
9. සුවඳ දුම් අල්ලන්න.
10. කිරි උතුරුවන්නට මල් යහන ඉදිරිපිට ලිප සාද තබන්න.

**● කිරිය**

රතු කැකුළු සහල් කිරි, පොල් කිරි, එනසාල්, කරදමුංගු එකට එක්කොට ලිප තැබූ දියරය පළමු වතුරු දකුණුකට හැදී තැනෙන් කිරිය සැලදී.

**● කැවුම්:**

කැවුම් සෑදීමේදී අච්චු කැවුම් වෙනුවට අතින් වත්කරන කොණ්ඩ කැවුම් සැකසීම සිදු කළ යුතුය.

**● කිරිබත:**

කිරිබත් සෑදීමේදී මීට කිරිය භාවිත කළ යුතුය. මීට කිරි සෑදීමේදී වතුර වැඩිමෙන් දමා පොඩි කිරීමෙන් වැඩි දියරක් සහිත පොල් කිරි එකවරින්ම ලබා ගන්න.

**● කෙසෙල් ගෙඩි:**

කෙසෙල් ගෙඩිවල අග කර කැටි කොටස් කපා ඉවත් කරන්න.

**● වතුර:**

පෙරූ වතුර භාවිතයට ගන්න.

**● මල්:**

දලුකු මල් වට්ටියක් සූදානම් කරගන්න.

**● බුදුන් වැඳීම:**

නිවසේ බුදුන් වඳින තැන සකසා තබන්න. බුදු පහන පමණක් දල්වා තබන්න.


**● දානය දෙන වේලාව:**

උදේ කලුවක් හවන්නට පෙර දිනය දිය යුතු වේ.

සාසප ඉඳුවර ගුණසේකර

# මටත් හොරා මගේ සිතත් ඔබ රැගෙන ගිහින්...!

## මෙහෙම කියන්නේ ඇයි?



ඔබ හොඳ සිහි කල්පනාවෙන් මේ තේරවිල්ල කියවා බලන්න. "ඔහු බොහෝ දුර ගමන් යන කෙනෙකි. නමුත් ඔහුට ශරීරයක් නම් නැත. ඔහු ජීවත් වන්නේ ගුහාවක් තුළයි." මේ තැනැත්තා කවුද කියා ඔබට කිව හැකිද? මේ තැනැත්තා ඔබ හැම කෙනෙකු තුළම සිටිනවා. ඔහු පුද්ගලයෙකු වෙන්නත් පුළුවන්. ඒ වගේම ශක්තියක් වෙන්නත් පුළුවන්. නමුත් ඉඳුරන්ට ගොදුරු වෙන්නේ නම් නැහැ.

මේ බොහෝ දුර ගමන් කර අපූරු තැනැත්තා නම් "සිත" යි. අපි යම් තැනක සිටිද්දී සිත වෙනත් තැනකට යැවිය හැකියි. ඒ වගේම අපි අතීතයේ ගිහින් තිබෙන ඕනෑම තැනකට සිතට ඉතාම වේගයෙන් ආපසු යන්නට හැකියි. අපටත් නොදැනීම සිත තැන් තැන්වලට යාමට පටන් ගනී. අපට සිත පෙනෙන්නේ නෑ. මන්ද යත් සිතට ශරීරයක් නොමැති නිසාය. මිනිසාගේ හදවත නමැති ගුහාව තුළ සිත ලැගුම් ගෙන සිටියි. සිත වාසය කරන්නේ මිනිසාගේ හදවත ඇසුරු කරගෙනයි. බුදු දහමේ සිත පිළිබඳව ඉගැන්වෙන ගාථාවක් ඔබ අසා ඇත.

"දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං

යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා"

දුර ගමන් යන, තනිව හැසිරෙන, ශරීරයක් නොමැති යනු ලක්ෂණයන් සහිත වූ සිත අපට අවනත නැති බව මෙයින් පැහැදිලි වේ. එවැනි අතිකාරී සිත යම්කිසි කෙනෙක් විසින් සංවර කර ගන්නේද, එම තැනැත්තාට මාරයාගේ උගුල්වලින් ගැලවිය හැකිය. මෙයින් කියවෙන්නේ මනාව සිත පාලනය කරගැනීමේ නැතහොත් සිත සංවර කර ගැනීමේ ඇති වැදගත්කමයි. පාඩම් කරන දෙය මතක තබා ගැනීමට මෙන්ම ඕනෑම කටයුත්තක් නිසියාකාරව කරගැනීමට සිත පාලනය කරගැනීම වඩා වැදගත් වේ. අපට අවනත නොවී ඒ මේ අත දුවන සිත භාවනාව තුළින් සංවර කර ගැනීමේ හැකියාව ඇත. සිත සංවර කරගැනීමේ වැදගත්කම බුදුදහම තුළින් මනාව පෙන්වා දී තිබේ. සිදුහත් බෝධිසත්වයන් වහන්සේද බුද්ධත්වය

ලබාගන්නේ හිත සංවර කරගෙන දියුණු කරගැනීමෙනි.

ධම්මපදයෙහි ඇතුළත් වන ඉහත සඳහන් ගාථාව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුවේ යම් සිද්ධියක් මුල්කරගෙනය. සැවැත්නුවර සංඝරක්ඛිත නම් තෙරනමක් විය. උන්වහන්සේගේ නැගණියගේ පුතණුවන් හට උන්වහන්සේගේ නම (සොහොයුරාගේ) තබා හද වඩාගෙන නිසි වයසට පැමිණි පසු පැවිදි කරනු ලැබූහ. පැවිදි කරනු ලැබූ පොඩි හාමුදුරුවෝ "භාගිනෙය්‍ය - සංඝරක්ඛිත" නම් විය. වරක් වෙනත් ගමක වස් විසූ භාගිනෙය්‍ය පොඩි හාමුදුරුවන්ට සත් රියන් හා අටරියන් රෙදි දෙකක් ලැබුණි. වස් අවසානයේ ගුරු හාමුදුරුවන්ගේ විහාරයට ආ භාගිනෙය්‍ය පොඩි හාමුදුරුවෝ අටරියන් රෙද්ද ගුරු හාමුදුරුවන්ට පූජා කළේය. ඉතාම ස්වල්ප දෙයකින් සතුටු වී සරල ජීවිතයක් ගත කරන ගුරු හාමුදුරුවෝ තමාට පිළිගැන්වූ රෙද්ද ගෝලයාටම ආපසු පැවරුවේය. ගුරු හාමුදුරුවන්ට පවන් සලමින් සිටි ගෝල හාමුදුරුවෝ පසුව මෙසේ කල්පනා කළහ.

"ගිහි කාලයේ මේ තැනැත්තා මාගේ මාමණ්ඩියයි. පැවිදි වූවාට පසු මාගේ ගුරුවරයායි. එහෙත් දන් ඒ සම්බන්ධකම් තබා ගන්නට කැමති නැති බවයි පෙනෙන්නේ. ඒ නිසා තමයි මා දුන් රෙද්ද පිළි නොගත්තේ. මේ නිසා මා සිවුරු හැරලා ගිහි වෙනවා."

ගුරු හාමුදුරුවන්ට පවන් සලමින් සිටින පොඩි හාමුදුරුවන්ගේ සිත වෙනත් කල්පනාවකය.

"ගිහි වුණාට පසුව මට රස්සාවකුත් එපායැ. මම මේ අටරියන් රෙද්ද විකුණා එළු දෙනක් ගන්නවා. එළු දෙනට ලැබෙන පැටව් විකුණා සල්ලි හොයාගෙන මම බිරිඳක් සරණ පාවා ගන්නවා. ඇයට දරුවෙකු ලැබුණායින් පස්සේ අපි තුන්දෙනාම කරත්තයකින් ගුරු හාමුදුරුවෝ බලන්නට යනවා. බිරිඳගේ නොසැලකිල්ලෙන් දරුවා කරත්තයෙන් වැටිලා අනතුරක් වුණොත් මම මේ කෙවිටෙන්ම ඇයට තලනවා." මෙසේ හිතමින් පවන් සලමින් සිටි වටාපත මිටෙන්ම ගුරු හාමුදුරුවන්ගේ හිසට පහර දුන්නේය.


> "හිත සංවර කරගැනීමෙන් මෙලොවත්, පරලොවත් දියුණුව ඇතිකරගත හැකිය. භාවනාව වැඩීම ඉතාම යෝග්‍ය වේ. කවර ක්‍රියාවක යෙදුණත් එය කෙරෙහිම හිත යොමු කර ක්‍රියාකිරීම වඩා යහපත්ය."

රහත්ව සිටි ගුරු හාමුදුරුවෝ ගෝල නමගේ සිතිවිලි බලා "සංඝරක්ඛිතයෙනි, බිරින්දෑට පහර දීමට නොහැකි බැවින් මට පහර දුන්නේ" දැයි ඇසූහ. ලැජ්ජාවට පත් ගෝල හාමුදුරුවෝ සිවුරු හැරීම සඳහා එතැනින් පැනයන්නට උත්සාහ කළහ. එහෙත් එහි සිටි අනෙක් පිරිස මේ ගෝල හිමිනම බුදුරදුන් වෙත කැඳවාගෙන ගියහ.

බුදුරජාණන් වහන්සේ "බොහෝ දුර ගමන් කරන හිත හික්මවා ගෙන රැකගන්නවා නම් මාර බැම්මෙන් මිදෙන්නට පුළුවන්" යන අදහස ඇති "දූරඞ්ගමං ඒකචරං..." ආදී ගාථාව වදාළ සේක. එය ඇසූ භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමි නිවන් මගට පැමිණ නැවතත් පැවිද්ද කෙරෙහි ආශාව ඇතිකර ගත්හ.

මේ අනුව හිත සංවර කරගැනීමෙන් මෙලොවත්, පරලොවත් දියුණුව ඇතිකරගත හැකිය. භාවනාව වැඩීම ඉතාම යෝග්‍ය වේ. කවර ක්‍රියාවක යෙදුණත් එය කෙරෙහිම හිත යොමු කර ක්‍රියාකිරීම වඩා යහපත්ය. කරන දෙයත්, සිතන දෙයත් එකක් වූ විට එයත් එක්තරා භාවනාවකි. අප සිතට යට නොවී සිත අප යටතට ගැනීම යහපත් වේ.

හර්ෂණී හේරත්
ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය



"යකඩයෙන් නැගුණ මලකඩ ඒම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## නිර්මල සිතක් ඇතිකර ගන්න






# ශ්‍රී පාදය පූජනීය වීමට හේතු

එස්.කේ. ජයවර්ධන



# නිරෝගීකම හැර සැපයක් වෙන ලොවේ කොයින්දෝ...

මෙම විශ්වයේ අති විශිෂ්ටතම නිර්මාණය මිනිසාය. උසස් මනසක් ඇති ජීවියාද මිනිසාය. ස්වභාව ධර්මය නැතිනම් ප්‍රකෘතිය වෙනස් කළ හැකි සත්වයා ද මිනිසාය. එබැවින් පොළු ජීවීන් මෙන් නොව මිනිසාගෙන් ලෝකයට සිදුවිය යුතු සේවාව අතිමහත්ය. එම සේවාව නොපිරිහෙලා ඉටුකිරීමට මිනිසා නිරෝගිමත්ව ජීවත් විය යුතුය. මිනිසා නිරෝගිමත් නොවූ විට ලෝකයද නිරෝගිමත් නොවනු ඇත. මිනිසාගේ නිරෝගිමත් භාවය යනු සමාජයේ නිරෝගිමත් භාවයයි.

ප්‍රාග්ඉතිහාසයේ සිටම මිනිසා ව්‍යාධීන්ගෙන් තොරව ජීවත් වීමට උත්සාහ ගෙන ඇත. බොහෝ විට අතීත මිනිසා තම ජීවිතයට බලපෑමක එක් උවදුරක් ලෙසින් ලෙඩ රෝග සැලකූ අතර නොපෙනෙන බලවේග විසින් ඒය ඇති කරන ලද්දක් බව ද විශ්වාස කළ බව පෙනේ. යක්ෂ, භූත හා දේව සමූහයාගේ කෝප බැල්මක් වීමෙන් ව්‍යාධීන් හටගන්නා ලෙසි සිතූ අතර ඒවින් මිදීමේ මාර්ගයක් ලෙස පූද පූජා පැවැත්වීම, යාතු කර්ම හා ශාන්තිකර්ම මඟින් උවදුරු දුරලා නිරෝගිකම ලබාගැනීමට උත්සාහ කළ බව පෙනේ.

මිනිසා කරා පැමිණෙන ව්‍යාධීන්හි ස්වභාවය වටහා දීමට නොයෙක් ආගම් උත්සාහ ගත් අතර බුදු සමය වඩාත් සාර්ථකවත්. ප්‍රතිපත්තිමය සාධක පදනම්කොට ගෙන මිනිසාගේ කායික මානසික රෝග පැහැදිලිව හඳුනාගනිමින් එයට මූලික වූ කරුණු මෙන්ම, නිවාරණ ක්‍රමවේදයන්ද පෙන්වා දෙනු ලැබිය. "ආරෝග්‍ය පරමා ලාභා" මිනිසාට ලැබෙන උතුම්ම ලාභය නිරෝගී බව යැයි බුදුරජාණන් වහන්සේ අවධාරණය කළහ. උන්වහන්සේ නිරෝගිකම නිරතුරුව රැකගැනීම පිණිස මිනිසාගේ පැවැත්ම කෙසේ සකස් විය යුතුද යන කාරණය සිය දේශනාවලින් ලෝකයාට පෙන්වා දුන්හ. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකිරීම බුදුරදුන් නිරතුරුවම අගය කළහ. සියලුම මානව වර්ගයාගේ නිරෝගී තත්ත්වය වර්ධනය කර ලීමට හේතු වන පොදු ක්‍රමවේදයන් බුදුරදුන් පෙන්වා දුන්හ. මානසික සෞඛ්‍යය සහ කායික සෞඛ්‍යය සම්බරව පවත්වාගෙන යාමෙන් අපගේ පෞද්ගලික ජීවිතය හා සමාජ ජීවිතයද සාර්ථක කර ගත හැකිය.

අංගුත්තර නිකායේ රෝග සූත්‍රයේ දී මිනිසාට වැළඳෙන ප්‍රධාන රෝග දෙකක් ගැන සාකච්ඡා කොට ඇත. එනම් කායික රෝගැසහ මානසික රෝග වශයෙනි. අප ශාරීරික සෞඛ්‍යය ගැන අවධානය යොමු කරනවා සේම මානසික සෞඛ්‍යය පිළිබඳවත් අවධානය යොමු කළ යුතුය. මානසික සෞඛ්‍ය සහ ශාරීරික සෞඛ්‍යය යන දෙක එකට බැඳී ඇත. ශාරීරිකව පිරිහුණු විට මානසිකවද පිරිහේ. මානසිකව ලෙඩ වූ විට ශාරීරිකවද ලෙඩ වේ. එම නිසා නිරන්තරයෙන්ම නිරෝගීව ජීවත් වීමට උත්සාහ ගත යුතුය. බුදුරජාණන් වහන්සේ කුසගින්න වනාහි බරපතළම රෝගය (ජිඝච්ඡා පරමා රෝගා) ලෙසින්ද , සෑම සත්වයෙකුම ආහාරයෙන් ජීවත් වන බවද (සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා) පෙන්වා දී ඇත. ආහාර ගැනීම මෙන්ම ආහාර පාලනය බොහෝ රෝගවලට පිළියමක් ලෙසද පෙන්වා දී ඇත (ආයුවඩ්ඪන සූත්‍රය). පාලනයෙන් ආහාර ගැනීමෙන් ශරීර සම්බාධතාව මෙන්ම ආයුෂ පාලනයද සිදුවන බව පෙන්වා දී ඇත. එම නිසා ශරීරයට යෝග්‍ය ආහාර ගැනීමත්, අවශ්‍ය ප්‍රමාණයට ආහාර ගැනීමත්, නිරෝගී සම්පන්න ජීවිතයකට අවශ්‍ය අංගයකි. චර්යාවකි.

දිනක් කොසොල් රජතුමා පමණට වඩා ආහාර ගෙන බුදුරදුන් අබියස දිගා වී සිටින විට බුදුරදුන් අනුදන වදාළේ, ආහාර ගැනීම වුවද පමණට වඩා නොකළ යුතු බවයි. වෙනත් වචනවලින් පැහැදිලි කරන්නේ නම්, බුදුරදුන් අදහස් කළේ ඕනෑවට වඩා ඕනෑම දෙයක් හොඳ නැති බවයි. මේ ආහාරයට අධික ආහාර ගැනීමෙන් සිදුවන හිරිහැර පිළිබඳව සහ ආහාර පාලනයෙහි හෙවත් පමණ දැන බොජුන් ගැනීමෙහි අගය සංයුත්ත නිකායේ කෝසල සංයුත්තයේ සඳහන් වේ. පමණ දැන ආහාර ගන්නා තැනැත්තාගේ දුක් වේදනාව නැතිවේ. ආයුෂ වැඩිවේ. නූතන සමාජයේ බොහෝ අය මෙය තේරුම් නොගැනීම නිසා නොයෙක් රෝගාබාධවලට ගොදුරු වී ඇත.

භික්ෂූන් වහන්සේලා අදාළ ආචාර ධර්ම අනුව ආහාර ගැනීමේ පිළිවෙල සේඛියාවල අන්තර්ගත වේ. ආහාර ගනිමින් කතා කිරීම, මුඛයට ආහාර පිඹිකිරීම , ආහාර හක්කේ තබාගෙන වැළඳීම , අත ගසා දමමින් වැළඳීම, තොල් ලෙවකමින් වැළඳීම වැනි ක්‍රියාවන් නොකළ යුතු යයි පෙන්වා දී ඇත. පරණ, ගුණදායක ආහාර ගැනීම නිරෝගී බවට හේතුවන බවත් අපථ්‍ය ආහාර ගැනීම ලෙඩ රෝගවලට හේතුවන බවත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ.

බුද්ධසමය නිරෝගීමත් ජීවිතය අගය කළ අතරම රෝගීන් සමාජයෙන් බැහැර කිරීමද ප්‍රතික්ෂේප කොට ඇත. රෝගීයකු කෙරෙහි සමාජයේ සැමගේ අනුකම්පාව හා දයාව ලැබිය යුතු යැයි බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන්ම පෙන්වා දුන්හ (යො භික්ඛවේ මං උපට්ඨෙය්‍ය සො ගිලානං උපට්ඨෙය්‍ය). යමෙක් මට උපස්ථාන කරන්නේ ද තෙමෙහෙම ගිලනුන්ට උපස්ථාන කළා වේයි. සමාජයේ තිබිය යුතුයේ අනුකම්පාව නොලැබූ ප්‍රතිගන්ධපීඩිත භික්ෂුවට බුදුරදුන් සියතින්ම උපස්ථාන කරමින් සුවපත් කිරීමට උත්සාහ ගත්හ. මහා කස්සප තෙර බොජ්ඣංග සහ මහා මොග්ගල්ලානතෙර බොජ්ඣංග සූත්‍රවලින් පැහැදිලි වන ආකාරයට මහා කස්සප හා මහා මොග්ගල්ලාන වැනි මහ තෙරවරුන්ට රෝගාබාධ හටගත් අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේ ඒ ස්ථානවලට වැඩම කොට සුව දුක් විචාළ බව පෙනේ.

රෝහල් සංකල්පයටද මූලික අඩිතාලම දමන ලද්දේ බුද්ධසමයයි. මහා ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණයට පෙර ඉන්දියාවේ බෞද්ධ රෝහල් තිබුණු බවට බොහෝ සාක්ෂි ඇත. ඊජිප්තුව වැනි

ප්‍රදේශවල ඈත අතීතයේ පටන් වෛද්‍ය ක්‍රම පැවතියද , රෝහල් පැවති බවට කිසිදු සාක්ෂියක් නැත. බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාවේ (British Medical Journal) මෙසේ සඳහන් වේ. "රෝහල් සංකල්පය ගැන ගෞතම බුදුන් වහන්සේට සහ උන්වහන්සේගේ අනුගාමිකයන්ට අපි ණයගැති වෙමු." මෙයින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ රෝහල් සංකල්පයේ සමාරම්භකයා වන බවයි. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ රෝගීන්ට උපස්ථාන කිරීමේ පහසුකම් සහිත, රෝගීන් රාශියකට සමූහ වශයෙන් නේවාසිකව සිටිය හැකි රෝහල් ක්‍රි.පූ. සිවුවෙනි සියවසේ පණ්ඩුකාභය රජසමයේ දී දක්නට ලැබේ. නව වැනි සියවසේදී ඉදිකරන ලද මිහින්තලේ රෝහල ලෝකයේ පැරණිතම රෝහලක් බව ඇතැම් විද්වතුන්ගේ අදහසයි.

පොළොන්නරුව මැදිරිගිරියේ බෞද්ධ රෝහලක් පැවති බවට ශිලා ලේඛන සාක්ෂි දරයි. අලාහන පිරිවෙනෙහි රංකොත් වෙහෙර සමීපයෙහි ආශ්‍රමීය රෝහල් පැවති බවටද සාධක හමු වී ඇත. අතීතයේ දී 'බෙහෙත් දීමත්, වෙදකම් කිරීමත්, සියල්ලම සිදුකරනු ලැබුවේ වෛද්‍යවරයා විසින්මය. ඒ නිසාම අතීතයේ වෙද මහත්මයාට සමාජයේ ඉහළ පිළිගැනීමක් සහ ගෞරවයක් තිබුණි. ගිලනුන්ට උපස්ථාන කොට ගිලානෝපස්ථානයේ අගය ලොවට පෙන්වා දීම මගින් බුදුරජාණන් වහන්සේ නිරෝගීව ජීවත්වීමේ අගය සහ රෝග ප්‍රතිකාරය හා උපස්ථානයේ වැදගත්කම බව ලෝකයට පෙන්වා දුන්හ. ගිලානෝපස්ථානය ශ්‍රේෂ්ඨ පුණ්‍යකර්මයක් ලෙස ප්‍රශංසාවට ලක්කළ බුදුරජාණන් වහන්සේ එයට ඉහළ සමාජ ඇගයීමක් ලබාදුන්හ. මෙයින් පැහැදිලි වන්නේ සෞඛ්‍ය පහසුකම්, භෛෂජ්‍ය, රෝග සත්කාරය යන වටිනාකම්වලට නියමු බලය සපයා ඇත්තේ බුදු දහම වන බවයි.

බුදුරජාණන් වහන්සේ විනය ප්‍රඥප්ති පැනවීමේ දී ද ගිලනුන් නිදහස් කොට ඇත. මෙයින් පැහැදිලි වන්නේ සහනශීලීත්වය ලබාදීමෙන් නිරෝගී බව අපේක්ෂා කළ බවයි. ගිලානා සහ ගිලානෝපස්ථායකයා අනුගමනය කළ යුතු වත් සමූහයක් ද බුදුරදුන් අනුදැන වදාළහ. රෝග නිවාරණයේ දී රෝග හටගැනීමට බලපාන පාරිසරික සාධක කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කමද බුදුරදුන් පෙන්වා දෙති.

ඔබ අප ජීවත් වන පරිසරය නිසි පරිදි පිරිසිදුව තබා නොගතහොත් රෝගකාරකයන්ට මෙන්ම රෝග වාහකයන්ට සුදුසු භූමියක් වනු ඇත. එම නිසා ජීවත් වන පරිසරය පිරිසිදුව තබාගැනීම අත්‍යවශ්‍ය වේ. පරිසර සංරක්ෂණ මූලධර්මය මත සිටිමින් බුදුරදුන් පවත්වන ලද දේශනා වදවන් වඩා අදට වැදගත්ය. සත්වයා සහ ජලය අතර ඇති සම්බන්ධය දැඩිව අවධාරණය කර ඇත. ජලය යනු අප පරිසරය තුළ ඇති අගනා සම්පතකි. එය අපවිත්‍ර වූ විට ජන සමාජයම රෝගී විම වැළැක්විය නොහැකිය.

නොගිලන්වූ ජබ්බග්ගිය භික්ෂූන් ජලයට කෙළ ගැසීම, මුත්‍රා කිරීම දුටුහ බුදුරදුන් එය වැළැක්වීම සඳහා ශික්ෂා පදයක් ද පැනවූහ. (න උදකේ අගිලානො උච්චාරංවා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමි" ති - සික්ඛා කරණීයාති.) බුදුරදුන් වදළ දහම් අනුගමනය කරන ඔබ සමස්ත පරිසරයම පවිත්‍රව තබාගැනීම ලෙඩ රෝගවලින් තොරව ජීවත් වීමට අවශ්‍යම සාධකයක් බව අමතක නොකළ යුතුය. ඩෙංගු, චිකුන්ගුන්යා , මැලේරියා වැනි මදුරුවන්ට දේශසීමා නැත. එම නිසා තාප්පයෙන් වට වූ ඔබේ නිවස ගැන පමණක් නොසිතා තාප්පයෙන් එහාත් අපේ පරිසරය බව සිතන්න. ආත්මාර්ථකාමිත්වය සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට බාධාවකි. පරාර්ථකාමීත්වය සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ආශිර්වාදයකි. ජල දූෂණය , පරිසර දූෂණය අවම කිරීමට හැමෝම මැදිහත් වීම වැදගත් වනුයේ එමගින් මුළු සමාජයම රෝගී කරන නිසාය.


බුදු රජාණන් වහන්සේ චූල්ලවග්ගයේ පෙන්වා දී ඇත්තේ කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය වේලා දූවිලි ඉවත් කළ යුතු බවත්, දොර ජනෙල් ඇර තබන ආකාරයත්, වැසිකිළි, කැසිකිළි පිරිසිදුව තබාගන්නා ආකාරයත්ය. එමෙන්ම පාචිත්තිය පාලියේ පැහැදිලිව පෙන්වා දෙන්නේ වැසිකිළිය රෝග කාරක වර්ධනයට උපකාරී වන තැනක් බවත්. එය හොඳින් පවිත්‍රව තබා ගැනීම ඉතා වැදගත් බවත්ය. තැන තැන මළ මූත්‍ර කිරීම, කෙළ ගැසීම , තැන තැන දැහැටි දඬු දැමීම, කුණු කසළ තැන තැන දැමීම නුසුදුසු බව බුදුරදුන් භාවිතයට විනය පිටකයේ දී පෙන්වා දී ඇත. අපස්සද්ධාවර ජාතක දේශනාවේ පුද්ගලයකුගේ දීර්ඝායුව සඳහා නිරෝගිකම ප්‍රමුඛ වන බව පෙන්වා දී ඇත.


"ආරෝග්‍යමිච්ඡෙ පරමඤ්චලාභං
සීලඤ්ච වුද්ධානු මතං සුතඤ්ච
ධම්මානුවත්තී ච අලීනතාච
අත්ථස්ස ද්වාරා පමුඛා ඡළෙතෙති"

1. නිරෝගී බව
2. සිල්වත් බව
3. වැඩිහිටි මතට අවනත වීම
4. ඇසූ පිරූ තැන් ඇති බව
5. දහැමි බව
6. නම්මැලි නොවීම

පෙසු පුරාණෝර සියල්ල සාධකය කරගත හැකි වන්නේ නිරෝගී සම්පත්තිය තිබුණොත් පමණක් බව ඉහත කරුණු පෙළගැස්ම අනුවද පැහැදිලිය.


ඇඳුම් , පැළඳුම්, ආහාර පාන, නිවාස හා පරිසරය යහපත්ව පැවතුන පමණින්, දුක් දොම්නස්වලින් තොරව ජීවත් විය නොහැක. පුද්ගලයකුට යහපත් ජීවිතයක් ගත කිරීමට මානසික තත්ත්වයද යහපත් විය යුතුය. මානසික වශයෙන් දුර්වල වූ විට, කායිකවද දුර්වල වීම වැළැක්විය නොහැක. බුදු දහම දෙස හැඟීමින් අධ්‍යයනය කරන විට පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ ද වෛද්‍යවරයෙකු බවයි. ලොව්වැඩ සඟරාවෙහි බුදුරදුන් වෛද්‍යවරයෙක් ලෙස හඳුන්වා දී ඇත. "සත් හට වන බව දුකට වෙදණන්" වාතය, පිත හා සෙම මුල් කරගෙන හටගන්නා රෝග නිවාරණය කරන්නට වෛද්‍යවරුන් ප්‍රතිකාර කරන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේ රාගය, ද්වේෂය , මෝහය යන දූෂිත





හැකියාව ඇත. එසේ නොහැකි වූ අප වෛරය, පළිගැනීම, භේද කිරීම වැනි නරක ක්‍රියාවන්වල නිරත වේ. අප සමග හොඳින් මිතුරුව සිටින විට පමණක් නම් අප අනිකාට මෛත්‍රී කරන්නේ එය නියම මෛත්‍රිය නොවේ. සතුරු වී සිටින විටත් අනිකාට මෛත්‍රී කළ හැකි නම් එය නියම මෛත්‍රිය වේ. එමගින් ඇතිවන මානසික සුවය අව්‍යාජවත් මානසික සුවයකි.

අද වන විට ශ්‍රී ලාංකේය සමාජයේ අවම පරමින් දිනකට තුන් දෙනෙක්වත් ඝාතනයට ලක් වේ. අසංවරව - අවිනීතව රිය පැදවීම නිසා හදිසි අනතුරුවලින් දිනකට දෙතුන් දෙනෙක්වත් මිය යති. විශාල පිරිසක් ආබාධිතයන් බවට පත්වේ. බොහෝ



මනෝභාවයන් හේතුකොටගෙන වැළඳෙන රෝග නිවාරණය කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ලබාදෙන්න. අප ජීවත්වන නූතන සමාජය අතිශයින්ම රෝගාතුර වී ඇත. මිනිසාගේ මනස කිළිටි කරන මනෝභාවයන්ට විශේෂ ක්‍රියාත්මක වීමට අවැසි සමාජමය පරිසරය ඉතා ඉහළින් නිර්මාණය වී ඇත. මානසික සුවය සඳහා හිතේ සතුට අත්‍යවශ්‍ය වේ. සතුටු වීමට අවශ්‍ය මනෝමූලයන් අභිබවා අකුසල මූලයන් ක්‍රියාත්මක වීම මගින් අනෙකාගේ දුක, වේදනාව, මරණය රස විඳින සමාජයක් නිර්මාණය වී ඇත. අප හැමෝම වාගේ අවස්ථාවන් උදා වන තෙක් පමණක් මෛත්‍රී කිරීමට පුරුදු වී ඇත. එහෙත් කාගෙන් හෝ සුළු වරදක් සිදුවුව පමණින් අප ඉවසන්නේ නැත. 'මගේ ඉවසීමේ සීමාව පැන්නා' යන වදන් නිතර අසන්නට ලැබේ. එයින් පිළිබිඹු වන්නේ මානසික නොදියුණු බවයි. ඉවසීමට හා මෛත්‍රියට සීමා දමා ඇති බවයි. බොහෝ අය මෛත්‍රී කරන්නේ තමන් කැමති දේ අහන්න ලැබෙනකම්. තමන් කැමැති විදියට කටයුතු සිදුවෙනවා නම් පමණි. තමන්ට ලැබෙනකම්, තමන් කැමැති විදියට කටයුතු සිදුවෙනවා නම් පමණි. තමන්ට ලැබෙනවා නම් හොඳයි, සෙසු අයට ලැබෙනවාට කැමති නැත. තමන් ගැන වර්ණනා කරනවාට හරිම කැමතිය. අනුන් ගැන වර්ණනා කරන විට තරහෙන් පිපිරෙයි. නුහුරු සහගත සිතුවිලි හමාගෙන එයි. ඊර්ෂ්‍යාව රජකරයි. අප අකමැති දෙයක් සිදුවූ වහාම ඉවසීම පලායයි. මෛත්‍රිය අතුරුදන් වෙයි. හික්මීම හදින් මෙන්ම ගතින් ද පලුවෙයි. ඒ වෙනුවට පාපී සිතුවිලි වහාම ක්‍රියාත්මක කිරීමට සැරසෙයි. යහපත් මානසික තත්ත්වයකින් පසුවන ප්‍රඥාවන්තයාට නරක මනෝභාවයන් ක්‍රියාත්මක වීමට පෙර යහපත් මනෝභාවයන් ජනිත කිරීමට මොළයට පණිවුඩ දීමේ

අප ගතින් නිරෝගී බව ප්‍රදර්ශනය කළ ද මනසින් නිරෝගී නොවේ. යහපත් සත්පුරුෂ සමාජයක් සඳහා මානසික සුවය අත්‍යවශ්‍යම වේ. අසහනය, පීඩනය සිතින් ඉවත් කොට, භාවනාවේ නිරත වීම මගින් සිත් පහන් කර ගැනීම ආගමික භේදයකින් තොරව සැම කෙනෙකුටම කළ හැකිය. එමගින් ප්‍රඥාව ලැබේ. බෞද්ධයාට එයින් ඔබ්බට ගොස් සමථ, විදර්ශනා ආදී භාවනා වැඩීමෙන් සසර දුක් නැති කොට සියලු කෙලෙස් සම්පූර්ණයෙන් නසා, නිවන් සුවය ලබා ගත හැකිය.

බුදුරජාණන් වහන්සේ මෙත්තානිසංස සූත්‍රයේ දී මෛත්‍රී සහගතව යහපත් මානසික තත්ත්වයකින් පසුවන සත්පුරුෂයන්ට ළඟාකර ගත හැකි ආනිසංස එකොළහක් දේශනා කළ සේක. එම අනිසංස එකොළහෙන් දහයක්ම අපට මේ ලෝක වශයෙන් අත්විඳිය හැකිවීම විශේෂ වේ. මෛත්‍රී සහගතව ජීවත්වන හැමෝටම ළඟාකර ගත හැකි ආනිසංස පහත සඳහන්ය.

1. සුඛං සුපති - සුවසේ නින්ද යාම
2. සුඛං පටිබුජ්ඣති - සුවසේ පිබිදීම
3. න පාපකං සුපිනං පස්සති - නපුරු සිහින නොපෙනීම
4. මනුස්සානං පියො හොති - මනුෂ්‍යයින්ට ප්‍රිය වීම
5. අමනුස්සානං පියො හොති - අමනුෂ්‍යයින්ට ප්‍රියවීම
6. දේවතා රක්ඛන්ති - දෙවියන් ආරක්ෂා කිරීම
7. නාස්ස අග්ගිවා විසංවා සත්ථංවා කමති - ගින්නෙන් වස විෂවලින්, ආයුධයන්ගෙන් හානියක් නොවීම.
8. තුවටං චිත්තං සමාධියති - සිත සමාධිගත වීම
9. මුඛවණ්ණො විප්පසීදති - මුහුණ පැහැපත් වීම
10. අසම්මූළ්හො කාලං කරොති - සිහි නුවණින් යුක්තව මිය පරලොව යාමට හැකි වීම
11. උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්ම ලොකූපගො හොති - ධ්‍යානවලින් නොපිරිහී කළුරිය කළහොත් බ්‍රහ්ම ලෝකවල ඉපදීම, යනුවෙනි.

චෛතසික හෙවත් මානසික වශයෙන් හානිකර වූ රෝග පීඩාවන් වයස් භේදයකින් තොරව ආගම් භේදයකින් තොරව අප හැමටත් වැළඳීමට ඉඩකඩ ඇත. එයින් මිදීමට සිත සමබරව තබාගැනීම ඉතා වැදගත්ය. මෛත්‍රී සහගත සිතුවිලි, සිත සමබරව තබාගැනීමට අවශ්‍ය වේ. සසර වසන සත්වයාට වැළඳෙන අනේකවිධ රෝගාබාධ හේතුවෙන් ඇතිවන දුක බුදු දහමෙහි ව්‍යාධි දුක නමින් හඳුන්වා ඇත. නිරෝගී බව නැතිනම්, 'ආරෝග්‍ය' යනු එම රෝගාබාධයන්ගෙන් තොරව ජීවත් වීමයි. එය උතුම් ලාභයක් ලෙස බුදුරදුන් පෙන්වා දී ඇත. එමෙන්ම කායික හා මානසික නිරෝගී බව තුළින් ලැබෙන සතුට ධනය ලෙස ද උන්වහන්සේ පෙන්වාදුන්හ. (සන්තුට්ඨී පරමං ධනං).

එබැවින් මනස සමබරව තබාගැනීම, ආහාර පාලනය, පරිසරය විනාශ නොකොට රැකගැනීම, රෝගීන්ට සැලකීම සහ රැකබලා ගැනීම, ඉවසීමෙන් හා විමසීමෙන් ජීවත් වීම යනාදී පුරුෂාර්ථ තම දිවියට ලංකර ගැනීම, කායික හා මානසික නිරෝගී බව ළඟාකර ගැනීමට ඉවහල් වන බව අප හැමෝම මතක තබා ගත යුතුව ඇත.

**ශාස්ත්‍රපති සිමාවේ පුඤ්ඤසිරි හිමි**
**ගුණසේකර ගුණදාරාම පිරිවෙන් විද්‍යායතනයේ**
**පෙරවරා අංශයේ නියෝජ්‍ය පරිවේණාධිපති,**
**මෙලියාන්න, තෙල්විල රාජමහා විහාරාධිකාරී**



# හොඳ මිතුරන් 4 දෙනා හඳුනා ගන්න

අද වර්තමාන සමාජය දෙස බලන විට හොඳ මිතුරන්ට වඩා මිත්‍ර ප්‍රතිරූපකයෝ බොහොමයක් දකිය හැකිය. මෙම නිසා හොඳ පුද්ගලයෝද නරක අතට හැරීමේ ප්‍රවණතාව වැඩිවේ. මෙම නිසා හොඳ මිතුරන් ආශ්‍රය කළ යුතුය.

"නහජේ පාපකේ මිත්තේ
නහජේ පුරිසාධමේ
හජේථ මිත්තේ කල්‍යාණේ
හජේථ පුරිසාදමේ"

යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ. එමෙන් නියම මිතුරෝ සතර දෙනා මෙසේ දක්විය හැකිය.

"චත්තාරෝ මේ ගහපති පුත්ත මිත්තා සුහදෝ වේදි තබ්බෝ සමාන සුඛදුක්ඛෝ මිත්තෝ සුහදෝ වේදි තබ්බෝ, අත්ථක්ඛායී මිත්තෝ සුහදෝ වේදි තබ්බෝ. උපකාරක මිත්තෝ සුහදෝ වේදි තබ්බෝ. අනුකම්පක මිත්තෝ සුහදෝ වේදි තබ්බෝ."

තම ජීවිත සාර්ථක හෝ විනාශාවන්ත කරගැනීමට යහපත් මිතුරන් සතර දෙනකු ඇසුරු කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබේ. එම සතර දෙනා නම්,

- උපකාර මිත්‍රයා හෙවත් උදව් කරන මිත්‍රයා
- සමාන සුඛ දුක්ඛ මිත්‍රයා හෙවත් සැප දුක දෙකෙහිම ළඟ සිටින මිත්‍රයා
- අත්ථක්ඛායී හෙවත් යහපත කියාදෙන මිත්‍රයා
- අනුකම්පක හෙවත් අනුකම්පා කරන මිත්‍රයා යනුවෙනි.

### උපකාරක මිත්‍රයා

කරුණු හතරකින් උපකාරක මිත්‍රයා හඳුනාගත යුතුවේ.

- පමත්තං රක්ඛති - පමාවූ මිතුරා රකී
- පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති - පමාවූ මිතුරාගේ ධනය රකී
- භීතස්ස සරණං හෝති - බියට පත්වූ මිතුරාට පිහිට වෙයි
- උප්පන්නේසු කිච්චකරණීයේසු තද්දිගුණං භෝගං අනුප්පදේති - කටයුත්තක් පැමිණි විට දෙගුණයක් ධනය දෙයි.

### අත්ථක්ඛායී මිතුරා

මෙම මිතුරාද කරුණු හතරකින් දැනගත යුතුය.

- පාපා නිවාරේති - පවින් වළක්වයි
- කල්‍යාණේ නිවේසේති - යහපතෙහි පිහිටුවයි
- අස්සුතං සාවේති - නොඇසූ දෙය ඇසීමට සලස්වයි
- සග්ගස්ස මග්ගං ආචික්ඛති - ස්වර්ග මාර්ගය (නිවන) පෙන්වා දෙයි

### සමාන සුඛ දුක්ඛ මිතුරා

මෙම මිතුරාද කරුණු හතරකින් දැනගත යුතුවේ.

- ගුය්හමස්ස ආචික්ඛති - තම මිතුරාට රහස් කියයි
- ගුය්හමස්ස පරිගූහති - මිතුරාගේ රහස් රකී
- ආපදාසු න විජහති - විපතේදී අත් නොහරී
- ජීවිතම්පිස්ස අත්ථාය පරිච්චත්තං හෝති - තම ජීවිතය පවා මිතුරා වෙනුවෙන් පුදයි.

### අනුකම්පක මිතුරා

මෙම මිතුරාද කරුණු හතරකින් දැනගත යුතුවේ.

- අභාවේනස්ස න නන්දති - මිතුරාගේ පිරිහීමට සතුටු නොවෙයි
- භාවේනස්ස නන්දති - මිතුරාගේ දියුණුවට කැමති වෙයි
- අවණ්ණං භණමානං නිවාරේති - මිතුරාගේ අගුණ කියන්නාවුන් වළක්වයි
- වණ්ණං භණමානං පසංසති - මිතුරාගේ ගුණ කියන්නාවුන්ට පසසයි

මේ ආදී වශයෙන් ඇසුරු කළ යුතු මිතුරන්ගේ අභිවෘද්ධියට කැමති වන මිතුරන් සතර දෙනා මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ හඳුන්වා දී ඇත. මේ ආකාරයට පාප මිත්‍රයෝ හා කල්‍යාණ මිත්‍රයෝ සිඟාලෝවාද සූත්‍රයෙහි මනාව පැහැදිලි කර දී තිබේ.

මිතුරන් තම මිතුරන්ට යුතුකම් පසකින් සංග්‍රහ කළ යුතුයි. එනම්,

- දානේන - වස්තුව ආදිය දීමෙන්
- පෙය්‍යවජ්ජේන - ප්‍රිය වචනයෙන් සංග්‍රහ කළ යුතුයි
- අත්ථ චරියාය - අවවාද ආදිය දී යහපතෙහි හැසිරවිය යුතුයි
- සමානත්තතාය - තමා හා සමානත්මතාවයෙහි පිහිටුවා සංග්‍රහ කළ යුතුයි
- විසං වාදනාය - නොරැවටීමෙන් සංග්‍රහ කළ යුතුයි

මේ ආකාරයට මිතුරන් විසින් තම මිතුරන්ට යුතුකම් ඉටුකරන විට එම මිතුරන්,


- පමත්තං රක්ඛති - පමාවූ මිතුරා රකී
- පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති - පමාවූ මිතුරාගේ ධනය රකී
- භීතස්ස සරණං හෝති - බියක් වූ විට පිහිට වෙයි
- ආපදාසු න විජහති - විපතේදී අත් නොහළ යුතුයි
- අපරාපජං චස්ස පටි පූජේති - මිතුගේ පරපුරට සැලකිය යුතුයි

මේ ආකාරයට යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා ප්‍රබල සාධකයක් වන මිතුරු සබඳතාව මනාව ශක්තිමත් කරගෙන එතුළින් හොඳ සමාජයක් බිහිකිරීමට සිඟාලෝවාද සූත්‍රයේ දක්වෙන කරුණු ඉතා වැදගත් වේ.

පූජ්‍ය මාදිගෙල විමලජෝති හිමි



අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති – ආරාමදූසක ජාතකය




# ගමේ මුදලාලිගෙ ධාර්මිකකම
# බුදුදහම නමැති
# තරාදියෙන් කිරන හැටි

බෞද්ධ සමාජ සංකල්පය අනුව භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව් පිරිස ගිහි හා පැවිදි වශයෙන් ප්‍රධාන දෙපිලකට බෙදෙන බව අපි දනිමු. ඒ අනුව ගිහියන් හා පැවිදි උතුමන්ගේ ජීවිත අරමුණු එකිනෙකට වෙනස්ය. ගිහියන් ලෞකික සුවය අරමුණු කොට ජීවත් වන අතර පැවිදි උතුමන් අධ්‍යාත්මික සුවය අරමුණු කොට ජීවත් වේ. ගිහි දිවිය හා සැසඳීමේදී පැවිදි දිවියේ ප්‍රධාන අරමුණ විය යුත්තේ නිර්වාණයයි. එහෙත් සංකීර්ණ අරමුණු පදනම්ව ගිහි ජීවිත ගත කිරීමේදී දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට මුදල් ඉපයීමට සිදුවේ. බුදු දහමට අනුව ගිහි මග හඳුන්වා ඇත්තේ ධනය ලබන මග ලෙසයි. ගිහි ජීවිතය හා ධනෝපාර්ජනය අතර මෙතරම් සමීප සබඳතාවක් දක්වා ඇත්තේ ගිහි ජීවිතය ආර්ථික චර්යාව හා බැඳී ඇති හෙයිනි.

වරක් ගෘහස්ථයන්ට ගැළපෙන ධර්මයක් ඉගෙනීම සඳහා තථාගතයන් වහන්සේ වෙත පැමිණි "දීඝජානු" නම් තැනැත්තා ගිහියන් හඳුන්වා ඇත්තේ "තථාගතයන් වහන්ස, අපි ගිහිව පස්කම් සැප විඳිමු. අඹු දරුවන් මැද වෙසෙමු. කසී සඳුන්, මල් ගඳ විලවුන් පරිභෝග කරමු. රන්, රිදී, මසු, කහවණු භාවිත කරමු." යනුවෙනි. එම ජීවන රටාව ගිහි පිළිවෙත ලෙස මැනවින් දත් තථාගතයන් වහන්සේ ඔවුනට ගැළපෙන දහමක් දෙසූහ. මෙහි සඳහන් වන රන්, රිදී, මසු, කහවණු භාවිතය යන්නෙන් අදහස් වන්නේ ආර්ථික ක්‍රියාවලියයි. ධම්මික සූත්‍රයේදී තථාගතයන් වහන්සේ ගිහි ජීවිතය විග්‍රහ කොට ඇත්තේ,

"ධම්මේන මාතා පිතරෝ භරෙය්‍ය
පයෝජයේ ධම්මිකං සො වණිජ්ජං
ඒතං ගිහී වත්තයං අප්පමත්තො
සයං පභෙ නාම උපෙති දෙවෙ" (406)

යනුවෙන්ය. එහි අර්ථය වන්නේ "ධර්මයෙන් ධනය උපයා මා පියන් පෝෂණය කරන්න. දැහැමි වෙළෙඳාමෙහි යෙදෙන්න. මෙසේ අප්‍රමාදීව ගිහි ගෙයි විසීමෙන් ස්වයං ප්‍රභ දෙවියන් අතර උපදී" යනුවෙනි.

ගිහියාගේ ආර්ථික චර්යාව සාර්ථක කරගැනීමට අදාළ උපදෙස් රාශියක් බුදු දහමින් සපයයි. ගිහියා විඳින සුව පිළිබඳ කරුණු දක්වමින් අත්ථි සුඛ, භෝග සුඛ, අණණ සුඛ හා අනවජ්ජ සුඛ වශයෙන් කරුණු සතරක් දක්වා තිබේ.

නූතන ආර්ථික චින්තනය හා බුදු දහමේ ආර්ථික චින්තනය අතර විශාල වෙනස්කමක් පවතී. තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත්තේ උට්ඨාන වීර්යයෙන් යුක්තව දැත දෙපය වෙහෙසා, දහදිය වගුරුවා, ශ්‍රමය යොදවා, ධාර්මික ලෙස ධනය උපයා ගත යුතු බවයි. වරක් කොතරම් හේතුවක් නිසාවත් අධර්මයෙන් සමෘද්ධිය නොපැතිය යුතු බව තථාගතයන් වහන්සේ දේශනා කොට තිබේ.

"න අත්ත හේතු - න පරස්ස හේතු
න පුත්ත මිච්ඡෙ - න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා"

(තමා වෙනුවෙන් හෝ අනුන් වෙනුවෙන් හෝ වැරදි අයුරින් දරුවකු, ධනයක් හෝ රටක් නොපතන, අධර්මයෙන් තම සමෘද්ධිය නොපතන තැනැත්තා සිල්වතෙකි, නුවණැත්තෙකි, ධාර්මිකයෙකි.)

බෞද්ධ ආර්ථික දර්ශනයට අනුව මිනිසාට මූලික ආර්ථික අවශ්‍යතා සමූහයක් වෙයි. එනම් ආහාරපාන, ඇඳුම් පැළඳුම්, වාසස්ථාන, යාන වාහන සහ බෙහෙත් හේත්ය. මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් අවශ්‍යතාවට මුල වන බැවින් අවශ්‍යතා සපුරා ගැනීමට මූලික වශයෙන් තමන්ට ගැළපෙන වෘත්තියක් හෝ ව්‍යාපාරයක් තෝරා ගැනීමට සිදුවේ. බුද්ධ කාලීනව පැවති වෘත්තීන් අතර,

- කෘෂි කර්මාන්තය (කසී)
- වාණිජ කටයුතු (වණිජ්ජා)
- පශු රක්ෂණය (ගෝරක්ඛ)
- රාජ්‍ය සේවය (රාජ පෝරිස)
- ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර)
- සමුද්‍ර සේවය (ඉසසත්ථ)

මෙම වෘත්තීන් අතරින් එකල වඩාත් ජනප්‍රිය වන්නට ඇත්තේ කෘෂිකර්මය, පශු රක්ෂණය හා වෙළෙඳාමය. වෙළෙඳාම් පහසුවෙන් පොහොසත් වීමට මෙන්ම පිරිහීමටද මගක් බැවින් ඇතැම් වෙළෙඳාම් හා උපක්‍රම අනර්ථකර බව තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත.

- සත්ව වෙළෙඳාම
- අවි ආයුධ වෙළෙඳාම
- විෂ වෙළෙඳාම
- මස් වෙළෙඳාම
- මත්ද්‍රව්‍ය වෙළෙඳාම

මෙවැනින් වැළකී යහපත් වෙළෙඳාමක නිරත වුවද කිරුම් මිනුම් ආදියෙන් වංචා සිදු කිරීමට ඇති ඉඩකඩ විවේචනයට ලක් කෙරේ.


- තුලා කූට - තරාදිය උපයෝගී කොට වංචා සිදුකිරීම.
- කංස කූට - භාණ්ඩයේ නැති ගුණ පැවසීම.
- මාන කූට - මැනීමේදී සිදුකරන වංචා.

මේ කවර රැකියාවක නිරත වුවද සාර්ථක ආර්ථික ජීවිතයක් සඳහා ගත හැකි උපදේශ රැසක් තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත.

- උට්ඨාන සම්පදා
- ආරක්ඛ සම්පදා
- කල්‍යාණ මිත්තතා
- සමජීවිකතා

මේ සියල්ල සලකා ඔබ නිතර දකින ප්‍රකට දානපතියාගේ, සමාජ සේවකයාගේ, එසේ නැතිනම් ගමේ මුදලාලිගේත් සැබෑ බෞද්ධකම ගැන සිතා බලන්න. එහෙමත් නැත්නම් ඔහුගේ ධාර්මිකකම ගැන සොයා බලන්න. ඇත්තටම ඔහු සැබෑ ධාර්මික බෞද්ධයෙක්ද? බුදු දහම නමැති තරාදියෙන් ඔබත් එය කිරා බලන්න.

**පුපුන් තිලක්ෂණ ගුණතිලක**
**ශ්‍රී නාථ දේවාල දහම් පාසල, මහනුවර.**



# බුදු රුවට පමණක් දෙවැනි වූ මහාකාශ්‍යප මහ තෙරුන්

## අල්පේච්ඡ දිවියක් ගත කරන්නවුන් අතරින් අග්‍රස්ථානය ලැබුවේත් උන්වහන්සේයි

ගෞතම බුදුරජාණන් වහන්සේගේ [illegible] ශ්‍රාවකයන් වහන්සේ ලෙස හැඳින්වෙන මහාකාශ්‍යප මහරහතන් වහන්සේ අල්පේච්ඡ දිවියක් ගත කරන්නවුන් අතුරෙන් (ධුතවාදීන්) අග්‍රස්ථානය ලැබූහ. උන්වහන්සේ තුළ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකට පමණක් පිහිටන දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් හතක් පිහිටා තිබුණි. එසේම රූපකායෙන් ද ගෞතම බුදුරජාණන් වහන්සේට බොහෝ සෙයින් සමාන විය. එබැවින් සමහර අවස්ථාවන්හි දී බුදුරජාණන් වහන්සේ යැයි වරදවා වටහාගෙන උන්වහන්සේට ජනතාව දන් පිළිගැන්වූ අවස්ථා තිබුණි.

උන්වහන්සේ මෙයින් කල්ප ලක්ෂයකට පෙර ලොව පහළ වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහ සඟනට සත් දිනක් මහත් වූ ශ්‍රද්ධාවෙන් දන් පිළියෙළ කර පිළිගන්වා, 'ස්වාමීනි, සත් දිනක් දන් දීමෙන් කරගත්තා වූ කුසල කර්මය හේතුවෙන් මම දිව්‍ය, මනුෂ්‍ය හෝ බ්‍රහ්ම සම්පත්තියක් නොපතමි. මතුවට බුදු සසුනක ධුතවාදීන් අතර අග්‍රස්ථානය ලැබීම හේතු වාසනා වේවා'යි පැවසීය. ඉන්පසු ද බොහෝ දානාදී පින්කම් කර මරණින් පසු දෙව්ලොව උපත ලැබීය.

ඉන් අනතුරුව ආත්මභාවයන් කීපයකට පසු අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි බ්‍රහ්ම ලෝකයෙන් චුතව විත් මගධ රට මහාතීර්ථ නම් බ්‍රාහ්මණ ගමෙහි පිප්පලීමාණව නමින් උපන් අතර, ඔහුගේ බිසව මද්‍ර රට සාගල නුවර කෝසියගොත්ත නම් බ්‍රාහ්මණයාගේ අග මෙහෙසුන් කුස භද්‍රකාපිලානි නමින් උපන්නාය. පිප්පලීමාණව විසි අවුරුදු වියට පැමිණි කල්හි ඔහුගේ මවුපියන් සුදුසු තැනකින් විවාහයක් කර දෙන්නට සිතුවත්, පිප්පලීමාණව එය ප්‍රතික්ෂේප කළේය. නමුත් මවුපියන් නිතර නිතර ඒ පිළිබඳව පවසන්නට වූ නිසා එයින් ගැලවෙන්නට උපායක් ලෙස, ඔහු රන්කරුවන් ලවා රන්කාසි දහසකින් අසා ගෙනෙන වූ ස්ත්‍රී රූපයක් තනවා මැනවින් ඔප දමා වස්ත්‍රාභරණයෙන් සරසා 'මෑණියනි, මේ රන් රුව බඳු වූ ස්ත්‍රී රත්නයක් ලදහොත් මම ඇය සරණ පාවා ගනිමි. නොලදහොත් මෙලෙසම වෙසෙමි'යි පැවසීය.

එවිට මෑණියෝ, 'අපගේ පුතුයා බොහෝ පින් ඇතියෙක් බැවින් ඔහු හා විසූමට පින් කළ කතක් ද සිටිය හැක. එම නිසා ඇය සෙවිය යුතුය'යැයි සිතා බමුණන් අට දෙනෙකු කැඳවා රන් රුව හා සමාන ස්ත්‍රී රත්නයක් සොයා ගෙන එන ලෙසට දැන්විය. බමුණෝ ද පළමුව මද්‍ර රටට ගොස්, එක්තරා නාහනතොටක රන් රුව තබා සැඟවී සිටියහ. එකල භද්‍ර පිලානිගේ කිරි මව ඇයව නහවා කිරි යාන් ගමටවේ හිඳුවා නාවන නාන තොටට පැමිණ රන් රුව දැක, භද්‍රකාපිලානි යැයි සිතා සිහි 'මේ කෙල්ල තුමට මෙහි පැමිණියේදැ'යි තර්ජනය කොට කම්මුලට පහරක් දුනි. ඇගේ අත්ල පුපුරා යන්නට වූ කල්හි ඇය, 'මේ මහ කළු ගලට මම මාගේ ස්වාමී දුව යැයි රැවටුණි. මැ අපේ ස්වාමී දුවට වස්ත්‍රය දීමටවත් නුසුදුසුය'යි කීවාය.

එය ඇසූ බමුණෝ ඈ සමීපයට පැමිණ 'තීගේ ස්වාමී දුව මීට වඩා ලස්සනද'යි විමසීය. එකල කිරි මව ඇගේ ලස්සන වර්ණනා කරමින්, 'මාගේ ස්වාමී දුව දොළොස් රියන් කාමරයක සිටින්නී නම් එහි පහන් දැල්වීමක් අවශ්‍ය නැතැ'යි කීවාය. එවිට අසා සතුටට පත් බමුණන් ඇයත් සමඟම කෝසියගොත්ත බමුණාගේ ගෙදරට ගියහ.

බ්‍රාහ්මණයා ද ඔවුන් පිළිගෙන ඔවුන් පැමිණි කරුණ විමසා, ඉක්බිති ජාති කුල ගෝත්‍ර විමසා 'යහපති. දරුවනි, අප සමාන කුල ජාති ගෝත්‍ර හා සම්පත් ඇති තැනකට දැරිය දෙමි'යි පවසා ගෙන ගිය පඬුරු පිළිගත්තේය. එකල්හි බමුණන් විසින් එය කපිල බ්‍රාහ්මණයාට දැන්වූහ. මවුපියෝ සුදුසු ස්ත්‍රියක් ලද බව පිප්පලීමාණවට හට දැන්වූහ.


එවිට පිප්පලීමාණව, 'මම එබඳු දැරියක් නොලැබෙතියි සිතුවෙමි. එසේ වී නමුත් ලැබුණේයැයි මොවුන් කියති. මම මෙය නවතාලමි' සිතා 'භද්‍රාවෙනි, මාගේ බලාපොරොත්තුව ගිහිව සිටීමට නොවේ පැවිදි වීමටය. එම නිසා සුදුසු සැමියෙකු සොයා ගන්නැ'යි රහසින් හසුනක් යැවීය. ඒ වන විට සොළොස් වියෙහි සිටි භද්‍රා කුමාරිය ද තමා සරණ පාවා දෙන්නට යන බව අසා 'තමා පැවිදි වීමට බලාපොරොත්තුවෙන් සිටින බව පවසා' රහසින් හසුනක් යැවීය. සේවකයන් අත යැවූ මේ හසුන් වැඩිහිටියන් හට හසුවී ඔවුන් විසින් අන් හසුන් දෙකක් පිළියෙල කර දෙදෙනාටම යැවූහ. අවසානයේදී මවුපියන්ගේ උවමනාව මත ඔවුන්ගේ විවාහය සිදු විය.

එදින පිප්පලීමාණව හා භද්‍රා දෙදෙනාම මල් දම් දෙකක් ගොතවා ගත්තේය. රාත්‍රී කාලයේ සැතපීමට සයනයට ගිය කල්හි යහන මැද මල් දම් තබා 'යමෙකුගේ පැත්තේ මල් දම් මැලවුණ විටෙක ඔහුට රාග සිත් ඇති වූ බව දත යුතු යැයි' කියා එකිනෙකා නොගැටෙන සේ සයනය කළෝය. ඔවුන් මවුපියන් ජීවත්වන තාක් කල් ධන පරිහරණයෙන් ද වැළකී සිටියහ. මවුපියන්ගේ මරණයෙන් පසු අසූ කෝටියක ධනය සමග ඇත්, අස්, රිය ආදී විශාල ප්‍රමාණයක් හිමිවුණි.

එක් දිනක් පිප්පලීමාණව රථයකට නැගී කර්මාන්ත පරීක්ෂා කරන්නට යන ගමනේ දී, සීසා නැන්වලින් මතුවන පණුවන් කන කාක්කන් දැක 'මොවුන් කුමක් කරන්නේදැයි' ගොවියන්ගෙන් විමසීය. 'උතුමාණෙනි, පණුවන් කති'යි කීහ. එවිට 'මේ පව් හිමි වන්නේ කාටදැයි' ඇසීය. 'උතුමාණෙනි, ඔබටය' ජනයා කීහ. එවිට පිප්පලීමාණව තෙමේ 'මේ සියලු පාපයන් මට නම් මේ ධනයෙන් ඇති ප්‍රයෝජනයක් නම් නැත. සියල්ලම භද්‍රාවන්ට දී මහණ වෙමියි' සිතා ගත්තේය. එදින භද්‍රා ද තලකැලි තුනක් එළියෙහි වනා කිරිමිදුන් හා සිටින විට, කපුටන් විසින් තල පණුවන් කනු දැක, ඒ කුමක්දැයි විචාරා, එම පාපය තමන්ට හිමි වන බව දැන 'මේ සතුන් කරන පාපය මට හිමි වන්නේ නම් මේ සංසාරයෙන් ගොඩ ඒමක් නම් නැත. මම සියල්ලම සැමියා හට දී පැවිදි වන්නෙමි' ඉටා ගත්තාය.

පිප්පලීමාණව නිවසට පැමිණ ආහාර අනුභව කොට තම බිරිඳ අමතා තමන් සතු සියලුම ධනය ඇ හට පවරා පැවිදි වීමට අදහස් කරන බව පැවසීය. එකල්හි භද්‍රා කුමරිය තමන් ද මහණ වීමේ බලාපොරොත්තුවෙන් සතු ඇම්ණෙනා කුරු සිටි බව පැවසීය. එවිට ප්‍රීතියට පත් එම දෙදෙනා, ඔවුනොවුන් විසින්ම හිස්කෙස් බූ ගා කසාවත් හා මැටි පාත්‍ර ගෙන්වා 'මේ ලෝකයේ යම් රහත් කෙනෙක් වේ නම් අපේ පැවිද්ද ඔවුන් උදෙසායි' කසාවත් හැඳ පොරවා සිටුගෙදරින් බැස ගියහ. එහි විසූ නිසිවෙසුවන් ඔවුන් හඳුනා ගත නොහැකි වූ නමුත් තමන්ගේ දාසයින් සිටි ගම් හරහා යන විට දාසයින් ඔවුන් හැඳින ගත්හ. එකල ඔවුන් හඬා වැටී තමන්ලා කුමක් නිසා අනාථ කළේ දැයි ඇසීය. එකල කාශ්‍යප යුවළ ඔවුන් දාස භාවයෙන් මුදවා ඔවුන් හඬද්දීම පිටව ගියහ.

පැවිදි වීමෙන් පසු කාශ්‍යප නම් ලද පිප්පලීමාණව, යන ගමනේ 'මා පසු පසු මුළු දඹදිව තරම් වටිනා ස්ත්‍රියක් එන්නීය. අප දක්නා සමහරුන් පැවිද්දින් මොවුන් හට වෙන් විය නොහැකැයි සිතා සිත් දූෂ්‍ය කරගෙන අපායට' යනු ඇත. එසේ හෙයින් මා විසින් මැය හැර දමා යා යුතුයැ'යි සිතා, දෙමංසලකට පැමිණි



විට කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ තම අදහස භද්‍රාට පැවසූසේක. එවිට ඈය 'ස්වාමීනි, නුඹ වහන්සේ එක මගක් ගනු මැනවි. මම අනිත් මග ගනිමි'යි පැවසීය. පසුව භද්‍රා තුන් වරක් තෙරුන් වහන්සේ පැදකුණු කර වැඳ 'කල්ප ලක්ෂයක් බැඳී මිත්‍රත්වය අදින් කෙළවර වන්නේය. නුඹ වහන්සේ දකුණෙන් ඉන්න ජාතියේය. එම නිසා දකුණු මග යනු මැනවි. මම වම් මග ගනිමි'යි කියා වෙන් වූහ.

එකල්හි මහා කාරුණික වූ තථාගතයන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වසන සේක්, මේ පින්වතුන් මහත් වූ ධනස්කන්ධයක් හැර සියා මහණ වූ බව දැන, 'මා ද මොවුන්ට සංග්‍රහ කිරීම වටනේය'යි සිතා ගඳකිළියෙන් නික්ම තමන් වහන්සේ පමණක් තුන් ගව්වක් පමණ දුර ගමන් කර රජගහ නුවරටත්, නාලන්දාවටත් අතර වූ බහුපුත්‍රික නම් නුග රුක යට සමාධි මුද්‍රාවෙන් වැඩ සිටින සේක. කාශ්‍යප තෙරුණුවෝ දුරදීම බුදුරජාණන් වහන්සේ දැක 'මුන්වහන්සේ මාගේ ශාස්තෘවරයාණෝය. මාගේ පැවිද්ද මුන්වහන්සේ උදෙසාය'යි සිතා තථාගතයන් වහන්සේ වෙත එළඹ තුන් තැනක හිඳ වැඳ, "සත්ථා මෙ භන්තෙ භගවා, සාවකො හමස්මි, සත්ථා මෙ භන්තෙ භගවා, සාවකො හමස්මි" යනුවෙන්, 'ස්වාමීනි, නුඹ වහන්සේ මාගේ ශාස්තෘවරයාය, මම නුඹ වහන්සේගේ ශ්‍රාවක වෙමි'යි තෙවරක් කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ, "තස්මාතිහ තෙ කස්සප එවං සික්ඛිතබ්බං" යනාදී අවවාද තුනක් දුන්හ. කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඒ අවවාද තුන ඉතා ගෞරවයෙන් පිළිගැනීම උන්වහන්සේගේ උපසම්පදාව විය. එය ඕවාදපටිග්ගහණ උපසම්පදා නම් වේ. එසේ උපසම්පදාවට පත් කාශ්‍යප තෙරුන් වහන්සේ සමග නුග ගසේ මුලෙන් නැගිට පාරට පැමිණ මඳ දුරක් ගමන් කළ බුදුරජාණන් වහන්සේ එක්තරා ගසක් මුල විවේක ගන්නට සූදානම් වනු දුටු කාශ්‍යප තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ පට රෙදිවලින් කළ සඟළ සිවුර සතරට නමා තථාගතයන් වහන්සේට වැඩ සිටීමට පිණිස අතුළහ.


බුදුරජාණන් වහන්සේ එම සිවුර මත වැඩ සිටිමින්, 'කාශ්‍යපය, නුඹගේ මේ පට සිවුර ඉතා මෘදුය'යි වදාළ කල්හි, කාශ්‍යප තෙරුන් වහන්සේ 'ස්වාමීනි, මාගේ මේ පට සිවුර පිළිගන්නා සේක්වායි' කීහ. එකල්හි තථාගතයන් වහන්සේ 'කාශ්‍යපය, පරිභෝග කිරීම නිසා දිරා ඇති මේ සිවුර නුඹට පාවිච්චි කළ හැකිදැයි' විමසීය. 'එසේය, ස්වාමීනි, ලැබුණොත් පරිභෝග කරමියි' කී විට, බුදුරජාණන් වහන්සේ 'කාශ්‍යපය, මා විසින් මේ සිවුර ගත් දිනයේදී මහ පොළොව කම්පා විය. මේ සිවුර මඳ ගුණැතියෙකු හට නම් පරිහරණ කළ නොහැක. මෙය පිළිගන්නට හැක්කේ පිළිවෙත් කිරීමට සමත් පාංශුකූලික භික්ෂුන් වහන්සේ නමක් පමණියි' කියා කාශ්‍යප තෙරුන් වහන්සේ හට එම සිවුර අයසුු ලබාදුන්සේක. එකෙණෙහිම මහ පොළොව යළිත් කම්පිත විය. අනතුරුව කාශ්‍යප තෙරුන් වහන්සේ සත් දිනක් වීර්ය කොට අටවන දිනයේදී සර් කෙලෙසුන් නසා අරහත් භාවයට පත් වූහ. පසු කලෙක බුදුරජාණන් වහන්සේ මහාකාශ්‍යප රහතන් වහන්සේගේ ගුණ වදාරා 'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ධුතවාදානං යදිදං මහා කස්සපො' යනුවෙන් උන්වහන්සේට ධුතවාදීන් අතරින් අග්‍රස්ථානයේ තබා වදාළසේක.

රහත් භාවයට පත් වූ කාශ්‍යප තෙරුණුවෝ තමන් වහන්සේ රූපයෙන් බුදුරජාණන් වහන්සේට සමාන වන බැවින් බොහෝ අපහසුතාවයන්ට පත් විය. එකල එක් විදියක සිටි කාන්තාවක් සැම දිනම මහා කාශ්‍යප රහතන් වහන්සේට පිණ්ඩපාතය පිළිගැන්වීමට පුරුදුව සිටියාය. දිනක් ඒ මග බුදුරජාණන් වහන්සේ වඩිනා විට එම කාන්තාව මහා කාශ්‍යප හිමියන් වැඩියා



යැයි සිතා රවටි තමා සතස් කර සිටි බත් නැන්දක් බුදුරජාණන් වහන්සේට පූජා කළාය. පුර මොහොතකින් පිඩු පිණිස වඩින කාශ්‍යප හිමියන් දුටු කාන්තාව එසා දිව් ගොස් බුදුරජාණන් වහන්සේ තවත සාතුයට අත අතා ගෙදු බත් නැන්ද රැගෙන නැවත් මහා කාශ්‍යප හිමියන්ට පූජා කළාය. මෙයින් බුදුරජාණන් වහන්සේට සිදු වූ අපහාසුතාවය පිළිබඳ අමිහත් සංවේගයට පැමිණි මහාකාශ්‍යප තෙරණුවෝ, බුදුරදුන්ගේ අවසරය මත ආරණ්‍යවාසී වී හිමාලය වනයේ වැඩ වාසය කරමින්, 'යම් දිනෙක මාගේ ශාස්තෘ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක් ද එකල්හි මේ ගල් ලෙන ඉදිරියේ තිබෙන්නා වූ මේ මල් ගසේ සියලුම මල් පරවී බිම වැටේවා' යන්න අධිෂ්ඨාන කළේය. ඉන්පසු බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන තෙක්ම උන්වහන්සේ හිමාලය වනයේ භාවනා කරමින් උන්හ.

එත්තරා උදෑසනක කාශ්‍යප හිමියන් ගෙන් සිටි සියලුම මල් පරවී බිම වැටී තිබෙනු දැක එයින් බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ බව දැන තමන් වහන්සේගේ පා සිවුරු ගෙන කුසිනාරා නුවර බලා වඩින්නට විය. එකල්හි මල්ල රජදරුවන් ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කරන්නට සිතා චිට ඉතා අලංකාර වූ චිතකයක් සාදා එයට ගිනි දල්වන්නට



උත්සාහ කරන මුත් ගිනි නොදැල්වෙන්නට හේතු මහා අනුරුද්ධ රහතන් වහන්සේගෙන් විමසිය. එවිට මහා අනුරුද්ධ රහතන් වහන්සේ තම දිව්‍ය චක්ෂු ඥාණයෙන් බලා කාශ්‍යප රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට අවසන් ගෞරව දැක්වීම පිණිස වඩින බවත් එතෙක් කල් චිතකයට ගිනි නොදැල්වීම දෙවියන්ගේ අභිප්‍රාය බවත් දැන්වූහ. මහා කාශ්‍යප හිමියන් එහි පැමිණ ගෞතම බුදුරජාණන් වහන්සේගේ සිරි පතුල් වන්දනා කිරීමත් සමගම සතර වටින් චිතකයට ගිනි ඇවිළී යන්නට විය.

ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ විට එහි සිට සුභද්‍ර නම් භික්ෂුවක් 'ඇවැත්නි, ශෝක නොකරව්, නොවැලපෙව්. ඒ මහා ශ්‍රමණයාගෙන් අපි හොඳින් මිදුනෙමු. මේ තොපට කැපය. මේ අකැපයැයි ඔහුගේ නීති පැනවීමෙන් අපි පීඩා වින්දෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් අකමැතිනම් එය නොකරන්නෙමු'යි කියනු අසා, මතු යම් දිනෙක බුදුන් වදාළ ධර්මයට සිදු විය හැකි හානිය දැක එය වළක්වනු පිණිස ධර්ම සංගායනාවක් පැවැත්වීමට මුලිකත්වය ගත්හ. ඉන්පසු උන්වහන්සේ අජාසත් රජතුමාගේ රාජ අනුග්‍රහය මත රජගහ නුවර වේභාර පර්වතයේ සප්තපර්ණී ගුහාවේ පන්සියයක් රහතන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්විය.

එසර එකසිය විස්සක් ජීවත් වූ මහා කාශ්‍යප රහතන් වහන්සේ දිනක් තමන්ගේ ආයුෂ අවසන් වී ඇති බව දැන පසු දින කුක්කුට සම්පාත නම් පර්වතයේදී පිරිනිවන් පෑමට තීරණය කළ සේක. ඒ බව සහෝදර භික්ෂූන් වහන්සේලාට ද දැනුම් දී පසු දින පිඩු පිණිස වැඩම කර අවසන අජාසත් රජුට ද දැනුම් දීමට සිටව සියහ. එකල්හි රජු දිවා ආහාරය රැගෙන නිදාගන්නා බව දැන ගත් කාශ්‍යප හිමියන් රාජපුරුෂයෙන්ට තමන් වහන්සේ අද දින සවස කුක්කුට සම්පාත පර්වතයේදී පිරිනිවන් පාන බව රජුට දැනුම් දෙන්නැයි කියා ඉන් පිටව ගියහ. පසුව කුක්කුට සම්පාත පර්වතයට වඩින මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සාදිධි ප්‍රාතිහාර්ය පා රැස්ව සිටි පිරිසට අවවාද අනුශාසනා දී කුක්කුට සම්පාත පර්වත තුන මැද පිරිනිවන් පාන්නට අදහස් කළහ. එකල්හි එහි රැස්ව සිටි දෙවියෝ එහි ඇඳක් සාදා ඇඳේ පාද මත මල් පුරවන ලද පුන් කලස් සතරක් තැබූහ. එවිට මහා කාශ්‍යප රහතන් වහන්සේ ඇඳ මත පැනපී සමාපත්තියට සමවැදී මෙසේ අධිෂ්ඨානයක් කරන්නාහුය.

'මා පිරිනිවන් පෑ කල්හි මාගේ සරීරයට අනතුරක් නොවන සේ මේ පර්වත තුන එකතු වන සේක්වා. මා වටා ඇති පහන් නොනිවේවා. මල් පරවී නොයේවා. මතු යම් දිනක මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී තම පිරිස් සමගු මෙම ස්ථානයට වැඩම කර මාගේ සිරුර දකුණු අත්ලේ තබාගෙන, පින්වතුනි, මාගේ මේ අත්ලෙහි සිටින තෙරුන් වහන්සේ පිළිබඳව ඔබ දන්නෙහි ද? මොහු මේ කල්පයේ ලොව පහළ වී වදාළ ගෞතම බුදුරජාණන් වහන්සේගේ මහා කාශ්‍යප නම් රහතන් වහන්සේයි. ධූතාංගධාරී භික්ෂූන් අතර අග්‍රස්ථානය වූ මොහු පිරිනිවන් පාන තෙක්ම ධූතාංග රකිමින් කටයුතු කළේය ආදී වශයෙන් පොළොව කුඩා කර මාගේ ගුණ මහත් කොට දේශනා කරනා සේක්වා. එකල්හි උන්වහන්සේගේ ශ්‍රී හස්තයේදීම මාගේ සරීරය ගිනි ගෙන දැවෙන සේක්වා. එසේම මා පිරිනිවන් පෑ බව දැන මෙහි පැමිණෙන අජාසත් රජතුමන්ට මා වන්දනා කිරීමට මේ පර්වත තුන විවෘත වේවා. ඉන්පසු නැවතත් පර්වත එකට එක වේවා'යි යනුවෙනි.

අප බෝසතාණන් වහන්සේ එක් අවස්ථාවක රජකෙනෙක්ව ඉපදුණු විට, මෛත්‍රී බෝසතාණන් වහන්සේ එතුමාගේ ඇත්හලේ ඇතුන් නිත්වෙන ඇත් ගොව්වා විය. දිනක් රජු ඇතා පිට යද්දී ඇතාට ඇතින්නියකගේ ගඳ දැනී කැලයට පැන දිවූ අතර රජු ගසක එල්ලී බේරුණි. මින් වෛරයාව ආවේ ඇත් ගොව්වාටය. ඇතුන් මනුට අවනත නැතිබව රජු විසින් දෝෂාරෝපණය කරන ලදී. ඇතා දින කිහිපයකින් සිය අවශ්‍යතා සපුරාගෙන නැවත ආවේය. ඒ අවස්ථාවේ පිට ඉතා කීකරුව ඇත්ගොව්වා සමග කටයුතු කළේය. ඇත්ගොව්වා සිය ඇතා කීකරු බව පෙන්වීමට රජු කියන පැමි දෙයක්ම ඇතා ලවා කර පෙන්විය. එහෙත් රජු සෑහීමට පත් නොවීය. අවසානයේදී ගිනිගෙන දිලිසෙන යකඩ ගුලියක් ඇතාට හොඬයෙන් ගන්නට කීවේය. ඇතා ඇත්ගොව්වාගේ අණ පරිදි කඳුළු පිරි දෙනෙතින් එය ද කළේය. හොඬ චිරි චිරි යන හඬින් පුපුරමින් ඉවසා සිටියේය. ඒ හැතින් රජු වහා එය බිම දැම්මවිය. මෙහි විපාක ලෙස ඇත්ගොව්වාට ඉදිද සිටි මෛත්‍රී බුදුන් ද විපාක ලබයි. එනම් මහා කාශ්‍යප හිමියන්ගේ සිරුර ආදාහනය කරන්නේ මෛත්‍රී බුදු හිමියන් විසින්ය. ඒ ආදාහනය කරන්නේ ශ්‍රී හස්තය මත තබාගෙන බැවින්. එහි ගිනි සැරව බුදුහිමියන්ගේ ශ්‍රී හස්තය දැවී ඒ මත දිය බුබුලක් පැන නගින අතර, එය හේතුවෙන් මෛත්‍රී බුදුහිමියන් පිරිනිවන් පා වදාරණ සේක.

කාශ්‍යප මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය දැනගත් වහාම අජාසත් රජතුමාගේ සිහිය නැතිවිය. රජතුමාට විපතක් වෙතියි සිතූ ඇමතිවරු වෛද්‍යවරුන් ලවා උක් ප්‍රෑණ, කිරි, දී මණ්ඩි, මිපෙල්, ගඳ කලල්, මැටි කලල් සහ සීතල ජලය පිරෙයන බිරු 7 ක් සකස් කරන ලදී. ඉන්පසු රජතුමා උක් ප්‍රෑණ ඔරුවට දමා, අනතුරුව කිරි ඔරුවට දැමූ කල්හි රජතුමාට සිහිය ආවේය. මෙසේ තෙවරක්ම සිහිය නැති වී නැවත යථා තත්ත්වයට පත් වූ රජතුමා කුක්කුට සම්පාත පර්වත භූමියට ගිය විට මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ අධිෂ්ඨානයේ ආකාරයෙන් පර්වත තුන විවර විය. බොහෝ කම්පා වූ රජතුමා, මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ දේහයට දින 7ක් පූජා පවත්වා අවසන් විමත් සමගම නැවතත් පර්වත තුන එකතු විය.

සංඛ ඉන්ද්‍රනාත්
ශ්‍රී දළදා මාළිගාව

# සදහම් ප්‍රහේලිකා අංක - 75

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි ප්‍රකාශ මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා කැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 72, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, ශ්‍රීමත් එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු යැවිය යුතු අවසන් දිනය අප්‍රේල් 03 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ නොපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ඔබේ ඉල්ලීම පරිදි නිවැරදි පිළිතුරු මෙවර කලාපයේ සිට පළවේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | රු | 2 | | ■ | 3 | | 4 |
| ■ | ■ | | ■ | 5 | | ■ | |
| 6 | | | ■ | ■ | න | ■ | |
| | ■ | | ■ | 7 | ■ | 8 | ■ |
| 9 | | ත | ■ | | ■ | 10 | |
| ■ | ■ | | ■ | | ■ | | ■ |
| 12 | | ■ | 13 | ලේ | ■ | | ■ |
| ■ | ■ | 15 | | ■ | 16 | | |

## ▶ හරහට

1. සිදුහත් තවුසාණන් බුදුවෙනු පිණිස දුෂ්කර ක්‍රියා කළ දනව්ව.
3. චතුරාර්ය සත්‍යයන් එකකි.
4. මැය ගෙදර බුදුන් ලෙස සැලකේ.
6. අටලෝ දහමට අයත්ය.
9. මාර්ගය යන්නට සමාන වචනයකි.
10. පැරණි බෞද්ධ ග්‍රන්ථ ලියැවී ඇති භාෂාව.
12. සිදුහත් කුමරුගේ දේහ ලක්ෂණ බලා අනාවැකි පළකළ බමුණන් අටදෙනාගෙන් කෙනෙකි.
13. සැදැහැති බෞද්ධයෝ මෙය දිවිහිමියෙන් පුරකිති.
15. සෑම දානමය බුදුන් මෙය සවිකොට ඇත.
16. සීගිරිළය මේ නමින්ද හැඳින්වේ.

## ▼ පහළට

2. ප්‍රකට ජාතක කතාවකි.
3. සසර ගමනේ අවසානය මෙනනය.
4. සම්බුදුන්ට එවා කොතරම් යස් කළත් මදිය.
6. සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණ කළේ මෙම ගංගාවෙන් එතෙර වෙලාය.
7. පූජනීය ස්ථානයන්ට ඇතුල් වන පියගැට පෙළ දෙපස ඇති කලා නිර්මාණයකි.
8. බ්‍රහ්ම ලෝකවල ඉපදීමට උපකාර වන කුසල කර්මය මේ නමින් හැඳින්වේ.
13. සෑම දෙයකටම මුල් වන්නේ මෙය බව බුදුන් වහන්සේ දේශනා කළ සේක.

## ඔබත් දළදා වරුණට ලියන්න

දළදා වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන ප්‍රවෘත් සඟරාවකි. වසර නවයකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමගින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර හිමි පැවිදි ගිහි ඇතුළු අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සම්ප්‍රයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ ප්‍රවෘත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඊ.ජ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමු. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් මත්තේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

## ප්‍රහේලිකා අංක 72 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ

- තන්ද අකුණාවල, 214/5, අකුණාවල, පේරාදෙණිය.
- මිස්සක බණ්ඩාර ලෙව්දෙණිය, 61, හේත්තාවත්ත, තැන්නකුඹුර, මහනුවර.
- ලුම්බිණි අලුවත්තේගම, දෙරනාගම පාර, තෝරදෙණිය, මැදවල, හාරිස්පත්තුව.

## දළදා මාලිගයෙන් පණිවුඩයක්

● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සාවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සාවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට පෝෂණයකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපක්ෂයම) පලාලු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙනෙන නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී එමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොගැලපෙන බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට දැන්නේ දෙදැසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටින ඔබ පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.



# ඔබටත් නන්ද මාතාවක් විය හැකියි

මේ මහා භද්‍ර කල්පය ලොව පහළ වූ සිව්වන බුදුරජාණන් වහන්සේ වන අප භාග්‍යවත් වූ තථාගත සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ එක් විටෙක භික්ෂු සංඝයා අමතා මෙසේ වදාළ සේක.

"පින්බර මහණෙනි, මාගේ සම්බුදු සසුනේ උතුම් බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙන භික්ෂුවක් වෙත්නම්, නිරන්තරයෙන්ම, "මම සාරිපුත්ත, මොග්ගල්ලාන මහා ශ්‍රාවකයන් මෙන් මාගේ ජීවිතය හැඩගස්වා ගනිමියි" හික්මිය යුතුය. මේ උතුම් සම්බුදු සසුනේ බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙන කිසියම් භික්ෂුණියක් වෙත් නම් නිරන්තරයෙන්ම "මම ඛේමා, උප්පලවන්නා උත්තමාවියන් මෙන් මාගේ ජීවිතය හැඩ ගස්වා ගනිමි" යි හික්මිය යුතුය. උතුම් තුණුරුවන් සරණ ගිය උපාසකයෙක් වෙත් නම්, නිරන්තරයෙන්ම "මම චිත්ත ගෘහපති, හත්ථක ආලවක ගෘහපති මෙන් මාගේ ජීවිතය හැඩ ගස්වා ගනිමි" යි හික්මිය යුතුය. තවද තුණුරුවන් සරණ ගිය කිසියම් උපාසිකාවක් වෙත්නම්, ඇය "මම කුජ්ජුත්තරා වේළුකණ්ටකී, නන්ද මාතාවන් මෙන් මාගේ ජීවිතය සකස් කර ගනිමි" යි හික්මිය යුතුය.

එක් හිමිදිරි උදෑසනක අවදි වූ වේළුකණ්ටකී නන්ද මාතාව ඉතා සැදැහැ සිතින් යුක්තව, බුද්ධ ගෞරවයෙන් යුතුව මිහිරි හඬින් 'පාරායන වර්ගයේ' ගාථාවක් සජ්ඣායනා කරන්නට විය. මේ අවස්ථාවේ උතුරු දෙසින් දකුණු දෙසට ගමන් කරමින් සිටි සතර වරම් දෙව් රජ දරුවන් අතරින් එක් දෙවියෙක් වූ වෙස්සවණ දෙවියන් මේ මිහිරි හඬ අසා එහි නැවතී අසා සිටියේය. නන්ද මාතාව ගාථා ගායනය අවසන් කිරීමත් සමගම සාදු නාද දෙන්නට විය. මෙම සාදු

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇලුණේද, ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදාම සුවසේ පිබිදෙත්."

# මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූප දෙකකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළද වරුණ, දළද මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළද පෙරහර සහිත රාමු කරන ලද වටිනා සිතුවමක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අතුර ඕ. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන වාලට් බෙහරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)





පසුගිය සතියේ 'පුදබිම' නිවැරදිව නම්කොට ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

**පී. පී. එන්. පී. ජයසේකර**
අංක 52, එගොඩගම,
කටුගස්තොට

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළද මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

පසුගිය සඟරාවේ (පෙබරවාරි) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:
පොළොන්නරුවේ කිරි වෙහෙර

## පුන්සඳ රැස්



වැලි මළුවට පුන් සඳ රැස් වැටිලා
පන්සල් බිම සුදු ඇඳගෙන දැහැනට වැදිලා
අම්මා නැති බණ මඩුවේ පාළුව දැනිලා
මගේ දෙනෙත් කඳුළින් තෙමිලා

අම්මගෙ පන්පැදුරු කොණේ අටසිල් රැකලා
උණුසුම මැද රැය නිදිවරලා
අම්මා කියන බණ පද ඇහිලා
මගේ දෙනෙත් කඳුළින් තෙමිලා

මල් සුවඳයි සිල් සුවඳයි එකට මුසුවෙලා
විහාරයම සුවඳින් පිරිලා
බුදු සමිඳුගෙ මෙත් සිත ළඟ රැඳිලා
පුහුදුන් මගෙ සිත දැන් නිවිලා

**- දයා මැණිකේ**


## වීතරාගී බුදු පියාණෙනි

මෙත් සිසිලාරෙන් සිත් සුව සදන
කරුණා ආකර තෙත් පෙළ කුන්යම
මුදිතා ගුණ පිරි මධුර සුභාෂිත
තිලෝතිලක සම්බුද්ධ දිවාකර

අටා අඳුරු පට දුරළු පුරසඳ
දෙසූ බුදුන් දම් සඟ ගුණ මිනහර
නිවන් මගට සිත යොමවා ලෝ සත
භව කෙළවර දුටු හිමි සණරාමර

ප්‍රඥ ප්‍රදීප දල්වා නිතියෙන
මෝහඳුර දුරලා දම්සිත් දද බැඳ
සීල සුගන්ධය සිත් ආනන්දය
වීතරාගී බුදු පාද වඳිමි මම

**- කාමල් අජන්ත**



## දම් අමා සිසිල

අඩ වීටක් සොයමින් දෙරින් දෙර
මගේ පුතු සුවපත් කරන්නට
සිගා ගිය කඳුළැලි පෙරන්
හිමියන් මං කිසාගෝතමියයි...

හඬන හිත මගෙ නැගුව කඳුළැලි
දුටු බොහෝ දෙන සිනා නැගුවත්
මහා කුරුණෙන් හද පහන් කළ
සමිඳුනේ ඔබ මහා මෙත් ගඟුලයි...

ලොවේ අනියත දම් පසක් වන
මග කියා දී හද නිවා හළ
සසර ඔව දුක නිවන දිව ඔසු
සමිඳුනේ ඔබෙ අමා දම් සිසිලයි...

**- මාකෙල් පීරිස්**

## පා පියුම්

වෙහෙර මළුවේ - ළපටි බෝපත්
සිඹින මදනල - සතට සුවදෙයි
සසර කතරේ - දුවන ලෝහිත
අමා දම් ගඟ - සිසිඳ සැනසෙයි...//

ධවල පාටින් උදුල රැ සඳ
කෙලෙස් මල සිහි ලොවට පවසයි
අහස් විනිවිද නැගුණු කොත් මිස
අමා සුවසෙත හැගුම් දනවයි

මහා කරුණා ගුණෙන් පෝෂිත
සමිඳු රුව දුක සිත නිවී යයි
වැටී වැතිර මහිමි අසියස
පා පියුම් කඳුළින් දෙවාලයි

**- චන්ද්‍රකීර්ති මුතුකුමාර**



"දූෂිත සිත් නැති යමෙක් බැණීම් ඇණීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොට ගත් ඔහු උත්තමයෙකි."

### යටිනුවර රණවන පුරාණ රජමහා විහාරයේ

# ලෝකයේ උසම සක්මන් බුද්ධ ප්‍රතිමාව ඉදිවෙයි



යටිනුවර, ගෙපළාත, රණවන, මොළදණ්ඩ පිහිටි රණවන පුරාණ රජමහාවිහාරය කාගේත් නෙත්සිත් ඇදගන්නා, නයනාභිරාමණීය භූමිභාගයක පිහිටි ඓතිහාසික වටිනාකමක් ඇති පූජනීය විහාරස්ථානයකි. මෙපෙදෙස ප්‍රදේශයේ සිටි හෙණකැදිපිසෙරිඛණ්ඩාර දේවියගේ අනුග්‍රහය ලද, දර්ශනීය පරිසරයක වෙල්යායක් අබියස පිහිටි ගල්ලෙනක නිර්මිත වූ මෙහි විහාර මන්දිරය සැදැහැතියන්ගේ සිත්සතන් බුද්ධාලම්භන ප්‍රීතියෙන් පිනවවයි. කලක් වල්බිහිව තිබූ මෙම විහාරස්ථානය එහි විහාරාධිපතිව වැඩවිසූ අපවත් වී වදාළ වතුරකුඹුරේ ඤාණවිමල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ බලවත් උත්සාහය නිසා විහාර කර්මාන්තයන්හි දියුණුවක් ද ඇතිවිය. එතෙත් උන්වහන්සේ 1983 වර්ෂයේ දී හදිසි අනතුරකින් අපවත් වූයෙන් එහි අධිපතිත්වය මහාවිහාරවංශික සියාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය දිවුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන අනුනායක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේට පැවරුණි. අනතුරුව උන්වහන්සේගේ පූර්ණ ආශිර්වාදය මත ස්වකීය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යරත්නය වූ, සියාමෝපාලි මහානිකායේ කාරක මහා සංඝ සභික පූජ්‍ය අඹපිටියේ ශ්‍රී චන්දජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත මෙම ඓතිහාසික පුරාණ විහාරස්ථානයේ විහාරාධිපතිත්වය භාරවිය. එතැන් සිට මෙම විහාරස්ථානයේ සීඝ්‍ර දියුණුවක් ඇතිවිය. සතර පෙදෙසේ දායකකාරකාදීන්ගේ සැදැහැ සිත් වඩවන ආකාරයට අසල ගම්මානයන්හි පමණක් නොව බැහැර සැදැහැවතුන්ගේ ද නෙත් සිත් ඇදගන්නා ලෙස, අලංකාර සියලු විහාරාංගයන්ගෙන් මෙම විහාරස්ථානය ශෝභාමත් කොට පූජනීයත්වයට පත් කොට තිබීම බලවත් සතුටට හේතුවේ. අභිනව ධර්මශාලා, සංඝාරාම, අටවිසි බෝධිමන්දිරය, සාංචි තොරණේ ආකෘතිය ගත් විහාර තොරණ ආදිය ඉදිකිරීම හා ඒවා මහත් උත්සාහයෙන් මනරම් ලෙස නිර්මාණය කොට දැක්වීම දෙස් විදෙස් බැතිමතුන්ගේ ශ්‍රද්ධා ශක්තිය වඩා වර්ධනය කිරීමට හේතු වී ඇත.

මෙම විහාරස්ථානයේ පූජනීයත්වය හා අලංකාරත්වය තවදුරටත් දෙගුණ තෙගුණ කිරීම සඳහා අනුමහානුභාවයකයන් වහන්සේලා පිරිවරාගත් අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සක්මනෙහි යෙදෙන ආකාරය නිරූපණය කෙරෙන ලෝකයේ උසම මහාර්ඝ සක්මන් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමට කටයුතු කිරීම උන්වහන්සේගෙන් ඉටු වූ බලවත් ලෝක ශාසනික සේවාවකි. මෙම අසිරිමත් සක්මන් බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙත ගැටෙන සෑම බොදුනුවකුගේම බැතිබර සිත් බුදුබැතියෙන් පුබුදුවනු ලබයි. අඩි අසූවකින් සමන්විත උසින් යුතු මෙම ප්‍රතිමා වහන්සේ නිර්මාණය කොට නිමකර කිරීමට රුපියල් ලක්ෂ තුන්සියකට වැඩි මුදලක් වැය වී ඇත. උඩුනුවර මේරිවල සුරංග රාජවර්ධන මූර්ති ශිල්පියාගේ මූර්ති දායකත්වයෙන් නිර්මාණය වූ මෙම සක්මන් බුදුපිළිම වහන්සේ ප්‍රදේශයට ඉමහත් ආශිර්වාදයකි. එමගින් ප්‍රදේශවාසීන්ගේ ගෞරවාදරය මෙම පුණ්‍යභූමියට නිතර ලැබෙනවා පමණක් නොව සසුනේ චිරපැවැත්මට ද හේතු වනු නිසැකය.



අංග සම්පූර්ණ විහාරස්ථානයක පැවතිය යුතු ත්‍රිවිධ චෛත්‍යයන් එක් චෛත්‍යයක් සංකේතවත් කෙරෙන බුද්ධ මන්දිරය හා බුද්ධ ප්‍රතිමා වහන්සේ ජීවමාන ලෙස සාදා නිමකරලීමට දායක වීම බලවත් පුණ්‍යකර්මයකි. එය තරමක සැදැහැවත් පින්වතුන්ගේ නෙත් සිත් බුදුබැතියෙන් සපිරෙන ආකාරයෙන් ප්‍රතිමා කර්මාන්තයක් සිදු කිරීම බලවත් අපහසු කාර්යයකි. විශේෂයෙන් පැරණි රජමහාවිහාරයක් තුළ දර්ශනීය ලෙස ලෝකයේ උසම සක්මන් ප්‍රතිමා වහන්සේ නමක් ඉදිකිරීමට බැතිබර දායකත්වය සැපයීම බලවත් කුසලකර්මයක් වන්නේය. මෙම උතුම් පින්කමෙහිලා පූර්ණ දායකත්වය දී ඇති මහනුවර කුණ්ඩසාලේ රුහුණු ගුඩ් සමාගමේ නිර්මාතෘ - සභාපති දේශබන්ධු පද්මසිරි මුතුමාල මැතිඳුන්, චිත්‍රාංගනී මුතුමාල මැතිනිය සහ දූදරුවන් නිර්ලෝභීව ස්වකීය ධන පරිත්‍යාග යන් සිදුකොට ලෝකයේ උසම සක්මන් පිළිම වහන්සේ නමක් ප්‍රතිෂ්ඨාපනය කිරීම ඉතිහාස ගත වන මහැඟි පූජා සත්කාරයක් වන්නේය.

ඉතා දර්ශනීය ලෙස බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට බැතිමතුන්ගේ ගෞරවාදරයට හා පූජා ප්‍රණාමයට පත්වීම දීර්ඝ කාලයක් තිස්සේ පවත්නා සිරිතකි. දෙතිස්මහාපුරුෂ ලක්ෂණින් යුතු අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුපමේය වූ බුද්ධ දේහ විලාසය දක්වෙන මෙම සක්මන් බුද්ධ ප්‍රතිමා වහන්සේ නිර්මාණය කොට බොදු සිත් බුද්ධාලම්භන ප්‍රීතියෙන් තෙමා සතනා, උතුම් නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරී වූ සියලු දෙනාට ත්‍රිවිධරත්නයේ හා ශ්‍රී දළදා වහන්සේගේ ආශිර්වාදය නොමඳව ලැබේවායි බැති සිතින් ප්‍රාර්ථනා කරමු.

ජේ. මීගහකුඹුර

# දරුවන් සසුනට පූජා කරන දිළිඳු දෙමාපියන්ට ආධාර

## ● බුද්ධශාසන අමාත්‍යංශය තීරණය කරයි



තම පුතුන් පැවිදි කිරීම සඳහා ශාසනයට පූජා කරන දිළිඳු දෙමාපියන්ට ඔවුන්ගේ අවශ්‍යතා අනුව මූල්‍යමය සහ වෙනත් ද්‍රව්‍යමය ආධාර සැපයීමට බුද්ධ ශාසන අමාත්‍යංශය තීරණය කර ඇත.

බුද්ධ ශාසන අමාත්‍යංශය එවැනි තීරණයක් ගෙන ඇත්තේ මෑත කාලයක සිට ශාසනික සේවය සඳහා පැවිදි වීමට ඉදිරිපත් වන සාමණේර හිමිවරුන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතින බවක් පෙනී ගොස් ඇති බැවිනි.

මේ වන විට රට තුළ වෙසෙන බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සංඛ්‍යාව හතළිස් එක් දහසකට සීමාවී ඇති අතර වයස්ගතව අපවත් වන හෝ විවිධ හේතුසාධක මත උපැවිදි වන බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සංඛ්‍යාවට සාපේක්ෂව අලුතින් පැවිදි වීමට ඇතුළත් වන සාමණේර හිමිවරුන්ගේ සංඛ්‍යාවේ ශීඝ්‍ර අඩුවීමක් දකින්නට ලැබෙන බැවින් සම්බුද්ධ ශාසනයේ මතු දියුණුව සඳහා මෙවැනි තීරණයක් ගැනීමට සිදුවී ඇතැයි අග්‍රාමාත්‍ය සහ බුද්ධශාසන ඇමැති දි. මු. ජයරත්න මහතා "දළදා වරුණ" ට පැවැසීය.

මෙම නව වැඩපිළිවෙළ යටතේ පැවිදි වන සාමණේර හිමිවරුන්ගේ දෙමාපියන්ගේ අවශ්‍යතාවන් අනුව සිසිංම මුදල් ආධාරයක් හෝ ඉඩම් කැබැල්ලක් වැනි පරිත්‍යාගයක් ලබාගත හැකිය.

ඊට අමතරව අලුතින් පැවිදි දිවියට එළඹෙන සාමණේර හිමිවරුන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන තුරුම තම අමාත්‍යංශය සිවුපසයෙන් ඇප උපකාර කිරීමට පියවර ගෙන ඇති බවද අග්‍රාමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

එම මූල්‍යමය සහ ද්‍රව්‍යමය ඇප උපකාර ලබා දෙනු ලබන්නේ බුද්ධ ශාසන අමාත්‍යංශය යටතේ පිහිටුවා ඇති බුද්ධ ශාසන අරමුදලේ මෙහෙයවීමෙනි.


## මහියංගණ ශ්‍රී සුමන සමන් දේවාලයේ රිදියෙන් කැටයම් කළ ද්වාරය අස්ගිරි මහානාහිමි සුරතින් විවෘත කෙරේ



**මහනුවර** අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මහියංගණ ශ්‍රී සුමන සමන් දේවාලයේ රිදියෙන් කැටයම් කළ දොරටුව විවෘත කිරීමේ උත්සවයේදී සිය අනුශාසනාව පැවැත්වූ අයුරු ඡායාරූපයෙන් දක්වෙයි. අස්ගිරිය මහා විහාරයීය මහෝපාධ්‍යාය, මහනුවර ශ්‍රී නාථ දේවාල විහාරාධිපති ගොඩමගොඩ රතනසාර නාහිමිපාණන්ද මෙහි වැඩ සිටිති.

මෙදිනම ඓතිහාසික මහියංගණ රජමහා විහාරයේදී මහා සංඝරත්නය සියක් නමකගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අස්ගිරිය පාර්ශ්වයේ අතිපූජ්‍ය අනුනායක මහියංගණ රජමහා විහාරාධිපති ගලගම අත්ථදස්සී නාහිමියන්ගේ අනූහතර වෙනි (94) ජන්මෝත්සවය නිමිති කොට දීඝායු ප්‍රාර්ථනා කිරීමේ ආගමික වැඩසටහන් මාලාවටද අස්ගිරි මාහිමිපාණන් වහන්සේ සහභාගි වූහ. මෙම දීඝායු පින්කම තවත් සමන් සත්කාර වැඩසටහන් මාලාවක් සමඟ අස්ගිරි මහා විහාර කාරක සංඝ සභික මහියංගණ රජමහා විහාර භාරකාර පණ්ඩිත උරුලෑවත්තේ ධම්මරක්ඛිත හිමියන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණ. බුද්ධශාසන ආගමික කටයුතු භාර නියෝජ්‍ය ඇමැති කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා ප්‍රධාන සම්භාවනීය ගිහි-පැවිදි පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

## බෙන්තර ශ්‍රී සංඝරක්ඛිත සෝමානන්ද නාහිමි ගුණසමරුව මල්වතු මහා විහාරයේදී



**මහනුවර** මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යේෂ්ඨ කාරක සභික බෝතොට පුරාණ විහාරාධිපති බෙන්තර ශ්‍රී සංඝරක්ඛිත සෝමානන්ද නාහිමිපාණන්ගේ 26 වෙනි ගුණ සමරුව පසුගියද මල්වතු මහා විහාරයේ බෙන්තර පන්සලේදී මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක සාහිත්‍ය චක්‍රවර්ති නියන්ගොඩ විජයකිත්ති අනුනායක පණ්ඩිත දිඹුල්කුඹුරේ විමලධම්ම නාහිමි දෙනමගේ ප්‍රධානත්වයෙන් හා මල්වතු මහා විහාරයේ මහා සංඝයා වහන්සේලාගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

බෝතොට පුරාණ විහාරයේ වත්මන් ශාසනික දියුණුවේ ආදි කර්තෘවරයාණන් වූ සෝමානන්ද නාහිමියෝ මල්වතු මහා විහාරයේ උපසම්පද මංගල්‍යයෙහි ජ්‍යෙෂ්ඨ කර්මාචාර්ය වහන්සේ නමක් ලෙසත්, අත්තරගම පියරතන රජයේ විද්‍යාලයේ ධර්මාචාර්ය ලෙසත්, රාජ්‍ය අධ්‍යාපන අංශයේ සේවය කර ඇත.

මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ කාරක සභික බෙන්තර ශ්‍රී සංඝරක්ඛිත ලේඛනාධිකාරී බෝතොට පුරාණ විහාරාධිපතීන් වහන්සේගේ ගුරු දේවයන් වන සෝමානන්ද නාහිමි විහාරස්ථ ශ්‍රී දේවමිත්ත දහම් පාසලේ දශක කිහිපයක කාලයක් තිස්සේ ප්‍රධානාචාර්ය ලෙස සේවය කර ඇත. සෝමානන්ද නාහිමිට පින් අනුමෝදන් කරවන ගුණසමරු පින්කම් රේවත නාහිමි ප්‍රධාන උත්තමයන්වහන්සේගේ ශිෂ්‍ය මල්වතු මහා විහාර කර්මාචාර්ය හීනටියන මහින්ද හිමි ප්‍රධාන දායක දායිකාවන් විසින් සංවිධානය කර තිබුණි.

කේ. බණ්ඩාරනායක

## බෝ පුවත්

### අසිරිමත් මහ බෝ වන්දනාව සාර්ථකව අවසන්

**අනුරාධපුර** ජය ශ්‍රී මහ බෝධි සමිඳුන් අභියසදී මහනුවර සිරි සිදුහත් භික්ෂු පදනම සහ සිරිමහ බෝ පදනම මගින් 9 වෙනි වතාවටත් සිරිමහ බෝ සමිඳුන් සිරිලකට වැඩමවා වසර 2321ක් සපිරීම සහ පළමු රන්වැට ඉදිකර වසර 44ක් පිරීම මුල්කරගෙන පවත්වන ලද අසිරිමත් මහ බෝ වන්දනාව පසුගියදා සාර්ථකව අවසන් විය.

